**ඕස්ට්‍රේලියාවෙහි පැවැති 2022 අයි.සී.සී. ටී.20**

**ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරඟාවලිය සඳහා ශ්‍රී ලංකාව**

**නියෝජනය කළ ක්‍රිකට් කණ්ඩායම සම්බන්ධව සහ ඊට අදාලව**

**මතු වූ විවිධ චෝදනාවන් ද,**

**‘බොර්න් අගේන්’ ආගමෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට**

**වන බලපෑම් ද පරීක්ෂා කිරීම සඳහා පත්කළ**

**පංච පුද්ගල විශේෂ පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව**

# පිළිගැන්වීම

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය

ගරු රොෂාන් රණසිංහ මැතිතුමාට

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| **1.** | පෙරවදන | **1-3** |
| **2.** | පරීක්ෂණ මණ්ඩලයේ සංයුතිය සහ අධිකාරිය | **4-5** |
| **3.** | තොරතුරු රැස් කිරීම | **6-9** |
| **4.** | පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව | **10 -60** |
| • | නිරීක්ෂණයන් | **10 - 41** |
| ➢ | සංචාරය | **10-14** |
| ➢ | ධනිෂ්ක ගුණතිලක විසින් කාන්තාවකට ලිංගික අතවර සිදුකිරීම | **15** |
| ➢ | චාමික කරුණාරත්න විසින් පහනක් දැල්වීම සහ පුද්ගලයෙකු සමඟ ඇති වූ ආරවුල | **16-18** |
| ➢ | ‘බොර්න් අගේන්’ ආගමෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට වන අනිසි බලපෑම් | **19-23** |
| ➢ | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අරමුදල් අවභාවිතය | **24-34** |
| ➢ | ක්‍රීඩකයින්ගේ විනයට අදාලවූ කරුණු | **35-36** |
| ➢ | ක්‍රීඩකයින්ගේ ශාරීරික යෝග්‍යතා සහ මානසික පීඩා | **37-41** |
| • | නිර්දේශයන් | **42 -60** |
| **5.** | සාක්ෂි සම්පිණ්ඩනය | **61-161** |

## 1. පෙරවදන

ඉන්දියන් සාගරයේ ‘මුතු ඇටය’ යන විරුදාවලිය ශ්‍රී ලංකාවට ලැබ ඇත්තේ මෙරටේ ස්වාභාවික පිහිටීම සහ එහි පවතින ස්වාභාවික සුන්දරත්වය හේතුවෙනි. ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව වර්ධනය වීමට පටන් ගත්තේ බ්‍රිතාන්‍ය යටත් විජිත යුගය අවසන් වීමටත් ප්‍රථම 1880 ගණන්වල දීය. 1996 වර්ෂයේ දී පකිස්ථානයේ ලාහෝර් නුවර දී පැවති ලෝක කුසලාන තරඟාවලියේ දී ශ්‍රී ලංකාව ලත් ජයග්‍රහණයත් සමඟම, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර තලයේ ප්‍රමුඛස්ථානයකට ගෙන ඒමට එවකට සිටි ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට හැකියාව ලැබිණි. ඉන් අනතුරුව, ලෝක කුසලාන තරඟාවලියන්හිදී, අවසන් වටය දක්වා රැගෙන යාමට ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට දෙවරක් ම හැකියාව ලැබී ඇත.

ඉහත කී අන්දමට තම රටේ පවතින සුන්දරත්වය සහ ඉතිහාසය සම්බන්ධව යමෙකුට ඉමහත් ආඩම්බරයෙන් කථා කළ හැකියාව තිබුනද, 2022.10.16 වන දින 2022.11.13 වන දින දක්වා අතරතුර කාලයේ දී ඕස්ට්‍රේලියාවේ දී පැවැති 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරඟය වටා අප රට සම්බන්ධව අසන්නට ලැබුනේ ජයග්‍රහනයට වඩා පරාජයය. කීර්තියට වඩා අපකීර්තියය. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට පමණක් නොව, එම ක්‍රිකට් කණ්ඩායම තෝරා, සංවිධානය කරන ලද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට එරෙහිව එල්ල කළ විවිධාකාරයේ චෝදනාවන් සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරණය විය. ක්‍රීඩා සහ යෞවන කටයුතු

අමාත්‍යාංශය වෙත ද මීට අදාළ වූ චෝදනාවන් කිහිපයක් යොමු කර තිබිණි.

ඒ අනුව ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය ගරු රොෂාන් රණසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ එම අමාත්‍යාංශ ලේකම් විශේෂඥ වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා මහතා ද, ජාතික ක්‍රීඩා සභාවේ සභාපති අර්ජුන රණතුංග මහතා ද ඇතුළුව තවත් නිලධාරීන් සිව් දෙනෙකුගෙන් සමන්විත වූ කණ්ඩායමක් විසින් 2022.11.08 වන දින සාකච්ඡාවක් පවත්වන ලදී. එම සාකච්ඡාවේ දී, පහත දැක්වෙන ප්‍රධාන අරමුණු දෙක පැවැතිණි.

I ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර පොලිසිය මගින් අත් අඩංගුවට ගනු ලැබූ ක්‍රිකට් ක්‍රීඩක ධනිෂ්ක ගුණතිලක මහතා සම්බන්ධව ඉදිරි කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව සහ එවන් සිදුවීම් මින් ඉදිරියට ඇති නොවීමට ගත යුතු ඉදිරි ක්‍රියා මාර්ග පිළිබඳව.

II ජාතික සංචිතයේ ක්‍රීඩකයින්ගේ දක්ෂතා වර්ධනය කර 2023 දී පැවැත්වීමට නියමිත ලෝක කුසලානය සඳහා ක්‍රීඩකයන් පුහුණු කර ඔවුන්ගේ දක්ෂතා වර්ධනය කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතු ආකාරය.

ඉහත කී අරමුණු සම්බන්ධව දීර්ඝ සාකච්ඡාවකින් අනතුරුව තීරණයන් 15 ක් රැගෙන තිබුණි. ඒ අනුව, ඕස්ට්‍රේලියාවේ දී පැවැති 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරඟය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සම්බන්ධ වූ ජාතික ක්‍රිකට් කණ්ඩායම

සම්බන්ධයෙන් මතු වූ විවිධාකාරයේ චෝදනාවන් සම්බන්ධයෙන් සහ එවන් සිදුවීම් මින් ඉදිරියේ දී නැවතත් ඇති නොවීමට ගත යුතු ඉදිරි ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් නිර්දේශ ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීමට ගරු ක්‍රීඩා හා යෞවන කටයුතු ඇමති තුමා විසින් තීරණයක් රැගෙන තිබුණි. මීට අමතරව, 'බොර්න් අගේන්' ආගමික කණ්ඩායමට අයත් ක්‍රීඩකයින්ට වැඩි අනුග්‍රහයක් දක්වන බවට පවතින ප්‍රවෘත්ති සම්බන්ධවද විමර්ශනයක් කිරීමට ද තීරණය කර තිබුණි. ඒ අනුව පහත නම් සඳහන් විද්වතුන්ගෙන් සමන්විත පංච පුද්ගල මණ්ඩලය පත් කරන ලදී.

i. විශ්‍රාමික මහාධිකරණ විනිසුරු සරෝජිනී කුසලා වීරවර්ධන මිය,
ii. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් කිංස්ලි ප්‍රනාන්දු මහතා ,
iii. විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති සුදත් නාගහමුල්ල මහතා ,
iv. විශ්‍රාමික රියර් අද්මිරාල් ආනන්ද පීරිස් මහතා,
v. විශ්‍රාමික ක්‍රිකට් ක්‍රීඩක නලින් ද අල්විස් මහතා,

මීට අමතරව, නීතිඥ ශලිනි රෝෂනා ප්‍රනාන්දු මෙනෙවිය කමිටුවේ ලේකම්වරිය වශයෙන් පත් කිරීමත් සිදු කරන ලදී.

## 2. සංයුතිය සහ අධිකාරිය

ඉහත කී පංච පුද්ගල පරීක්ෂණ **මණ්ඩලයේ සංයුතිය** පහත සඳහන් ආකාරයෙන් විය.

**පරීක්ෂණ මණ්ලයේ සාමාජිකයින්:**

1. විශ්‍රාමික මහාධිකරණ විනිසුරු සරෝජනී කුසලා වීරවර්ධන මිය,
2. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් කිංස්ලි ප්‍රනාන්දු මහතා ,
3. විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති සුදත් නාගහමුල්ල මහතා ,
4. විශ්‍රාමික රියර් අද්මිරාල් ආනන්ද පීරිස් මහතා,
5. විශ්‍රාමික ක්‍රිකට් ක්‍රීඩක නලින් ද අල්විස් මහතා,

**ලේකම් වශයෙන්** නීතිඥ ශලිනි රෝෂනා ප්‍රනාන්දු මෙනෙවිය කටයුතු කළ අතර, විශ්‍රාමික අධිකරණ ලඝු ලේඛිකා අයිරාංගනි විජේරත්න මෙනෙවිය **යතුරු ලියනය කටයුතු** සිදු කරන ලදි.

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, විශේෂඥ වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා මහතාගේ 2022.11.23 වන දිනැති සහ 2022.12.10 වන දිනැති, අංක MOYS/DEV/SP/SLC/12/1 දරණ ලිපි මගින්, ඕස්ට්‍රේලියාවේ දී පැවැති 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරඟාවලිය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සම්බන්ධ වූ ජාතික ක්‍රිකට් කණ්ඩායම සම්බන්ධයෙන් මතු වූ විවිධාකාරයේ චෝදනාවන් සම්බන්ධයෙන් සහ එවන් සිදුවීම් මින්

අනාගතයේ දී නැවතත් ඇති නොවීමට ගත යුතු ඉදිරි ක්‍රියා මාර්ග සම්බන්ධව මෙන්ම, 'බොර්න් අගේන්' ආගමික කණ්ඩායමට අයත් ක්‍රීඩකයින්ට වඩා වැඩි අනුග්‍රහයක් දක්වන බවට වූ ප්‍රවෘත්තිය සම්බන්ධව ද විමර්ශනයක් සිදුකර, නිර්දේශ ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් සැපයීම සඳහා මෙම කමිටුවට අවශ්‍ය පුද්ගලයින්ගෙන් සාක්ෂි විමසා, තොරතුරු ලබා ගැනීමට සම්පූර්ණ බලය පවරන ලදි.

ඒ අනුව, විමර්ශනය පවත්වා ගෙන යාම සඳහා ජාතික ක්‍රීඩා සභාවේ රැස්වීම් ශාලාව යොදා ගන්නා ලදි.

## 3. තොරතුරු රැස් කිරීම.

ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධව දැනුමක් ඇති සහ උනන්දුවක් දක්වනු ලබන ක්‍රිකට් ක්‍රීඩාව ජාත්‍යන්තර තලය දක්වා දියුණු මට්ටමකට ගෙන ඒමට විශාල දායකත්වයක් ලබා දී ඇති ජාතික ක්‍රීඩා සභාවේ සභාපති දේශමාන්‍ය අර්ජුන රණතුංග මහතාවද, 2022.10.16 වන දින ඕස්ට්‍රේලියාවේ දී පවත්වන ලද ටී.2020 ලෝක කුසලාන ක්‍රිකට් (පිරිමි) තරඟාවලිය සම්බන්ධයෙන් කරුණු කාරණා දන්නා රාජ්‍ය නිලධාරීන්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන්, ජාතික ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයින්, 'බෝර්න් අගේන්' ආගම මෙහෙයවන දිවැසිවර 'ෆෙඩ්රික් ක්‍රිස්ටෝපර් ජෙරම් ප්‍රනාන්දු' යන අයවළුන් ද කැඳවා සාක්ෂි සහ ඊට අදාළ ලේඛනයන් ලබා ගැනීමටත් තීරණය කරන ලදී.

කෙසේ වුවද, මෙම මණ්ඩලයේ වාර්තාව ඉතා කෙටි කාලයකින් ලබා දිය යුතුව තිබූ බැවින්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සියළුම නිලධාරීන් හෝ ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමේ සියළුම ක්‍රීඩකයින් කැඳවීම ප්‍රායෝගික නොවීය.

එනමුදු , ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටු නිළධාරින් දහසය දෙනෙකුගෙන් අඩකටත් වැඩි පිරිසක්, දිනකට ඇමෙරිකානු ඩොලර් 700 ක් පමණ බැගින්, දින දහයකට ඇමෙරිකානු ඩොලර් 7000 ක් පමණ විශාල මුදලක් ලබා ගනිමින්, ව්‍යාපාරික පංතියෙහි ගුවන් ප්‍රවේශ පත්‍ර ලබා ගෙන .2020 ලෝක කුසලාන ක්‍රිකට් (පිරිමි) තරඟාවලිය සඳහා යැයි ඕස්ට්‍රේලියාවට ගොස් තිබූ බවටත්, එහිදී ප්‍රධාන මෙහෙයුම් නිලධාරි

ජෙරොම් ජයරත්න මහතා, මුළු තරඟාවලිය පුරාවටම සිටියේ ඔහුගේ සහෝදරියගේ නිවසේ බවටත් සහ තරඟාවලිය සඳහා කිසිදු දායකත්වයක් නොතිබූ බවටත් අනාවරණය වූයෙන්, එසේ ඕස්ට්‍රේලියාවේ දී පවත්වන ලද ටී.2020 ලෝක කුසලාන ක්‍රිකට් (පිරිමි) තරඟාවලියට සහභාගිවූ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටු නිළධාරින්ගෙන් තරඟාවලිය සඳහා තිබූ දායකත්වය සොයා බැලීම සඳහා, ජයන්ත ධර්මදාස, රවීන් වික්‍රමරත්න, සුජීව ගොඩලියද්ද, ක්‍රිෂාන්ත කපුවත්ත, ජනක පතිරණ, තිලක් වතුහේවා, සමන්ත දොඩම්වල, ප්‍රියන්ත අල්ගම, බන්දුල දිසානායක, රියර් අද්මිරාල් නිශාන්ත ද සිල්වා, නලීන් අපොන්සු යන නිලධාරීන්ව කැඳවීමට තීරණය කරන ලදී. එපමණක්ද නොව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ගිණුම් වාර්තා සළකා බැලීම සඳහා ප්‍රධාන මූල්‍ය නිලධාරි වූ මහේෂ් බෝපගමගේ මහතාව ද සාක්ෂිකරුවෙක් වශයෙන් කැඳවීමට තීරණය කරන ලදී. ඒ අනුව, මෙම මණ්ඩලයේ ලේකම්තුමියගේ දුරකථනය මගින් 2022.12.18 වන දින පැමිණීමට 2022.12.15 වන දිනයේදී එම නිලධාරීන්ට දැනුම් දීමක් සිදු කරන ලද මුත්, එසේ පැමිණ සහයෝගය ලබා දීමට ඔවුන්ගේ යහපත් ප්‍රතිචාරයක් නොතිබූ හෙයින්, 2022.12.18 වන දින පැමිණීමට 2022.12.16 වන දින නොතිසියක් පවා නිකුත් කරන ලදී. එනමුදු ඒ සියළු දෙනාම කිසිදු සාධාරණ හේතුවක් නොදක්වා, මෙම මණ්ඩලය ඉදිරියෙහි පෙනී සිටිමෙන් වැලකී සිටින ලදී.

මේ අනුව, පහත සඳහන් අයවළුන්ගෙන් සාක්ෂි ලබා ගන්නා ලදී.

i. ජාතික ක්‍රීඩා සභාවේ සභාපති දේශමාන්‍ය අර්ජුන රණතුංග මහතා.
ii. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් අමල් එදිරිසූරිය මහතා.
iii. ශ්‍රී ලංකා ක්‍රිකට් **ආයතනයේ** ලේකම්,මොහාන් ද සිල්වා මහතා.
iv. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි ඇෂ්ලි ද සිල්වා මහතා.
v. ක්‍රිකට් ක්‍රීඩක චාමික කරුණාරත්න මහතා.
vi. ශ්‍රී ලංකා ක්‍රිකට් තේරීම් කමිටුවේ සභාපති ප්‍රමෝද්‍යා වික්‍රමසිංහ මහතා.
vii. ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කළමනාකාර මහින්ද හලංගොඩ මහතා.
viii. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරි ජෙරොම් ජයරත්න මහතා.
ix. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ භාණ්ඩාගාරික ලියනගේ ලසන්ත සදානන්ද වික්‍රමසිංහ මහතා .
x. ක්‍රීඩා අමාත්‍යාශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා, සංවර්ධන වශයෙන් කටයුතු කරනු ලබන හෙට්ටිආරච්චිගේ චතුරි නිරුක්ෂිකා මිය .
xi.'බෝර්න් අගේන්' ආගමික, ෆෙඩ්රික් ක්‍රිස්ටෝපර් ජෙරොම් ප්‍රනාන්දු ,
xii. ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා වෛද්‍ය ඒකකයේ වෛද්‍ය කිරිඇල්ල ආරච්චිගේ ප්‍රදීප් කිරිඇල්ල මහතා .
xiii.ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති,අටුළුගමගේ ශම්මි ශිරාජ් සිල්වා මහතා .
xiv. ක්‍රිකට් ක්‍රීඩක මැස්ටියගේ දොන් ධනිෂ්ක ගුණතිලක මහතා ,.
xv. ක්‍රිකට් ක්‍රීඩක භානුක බණ්ඩාර රාජපක්ෂ මහතා .
xvi. ශ්‍රී ලංකා ටී.2020 සහ එක් දින ජාතික ක්‍රිකට් කණ්ඩායමේ නායක මැදගමගමගේ දසුන් ශානක මහතා .
xvii. ක්‍රීඩක සම්භාහක රෝහාන් ප්‍රියදර්ශන විජේවීර මහතා .

මෙම මණ්ඩලයේ වාර්තාව සැපයීම සඳහා පැවතියේ කෙටි කාලයක් වූ බැවින් සහ ඇතැම් අයවළුන් විදේශගතව සිටි බැවින්, එසේ විදේශගතව සිටි අයවළුන්ගේ ප්‍රකාශ ලබා ගැනීමට සූම් තාක්ෂණය භාවිතා කිරීමට තීරණය කරන ලදී. මෙම මණ්ඩලය ඉදිරියේ සාක්ෂි දෙනු ලැබූ සැම අයෙකුටම, තම සාක්ෂිය නිවැරැදිව නිදහස්ව ලබා දීම සඳහා සුදුසු ස්ථානයක් පිළියෙළ කරමින් ඒ සඳහා ජාතික ක්‍රීඩා සභාවේ ශාලාවක් යොදා ගන්නා ලදි. තවද, සූම් තාක්ෂණය භාවිතා කල සාක්ෂිකරුවන් දෙදෙනා වූ අර්ජුන රණතුංග මහතාත් සහ ධනිෂ්ක ගුණතිලක මහතාත් හැරෙන්නට, සෙසු සියළුම සාක්ෂිකරුවන් සාක්ෂි ලබා දුන් අවස්ථාවේ දී, සාක්ෂිකරු ඉදිරිපිට දී දෙනු ලබන සාක්ෂිය යතුරු ලියනය කර, එම සාක්ෂිය කුමක්දැයි ඔවුනට මනාව දර්ශනය වන පරිදි පුළුල් තිරයක ද පෙන්වීමට ඉඩ සලස්වන ලදී. එසේම සාක්ෂි ලබා දුන් වහාම එය කියවා බැලීමටත්, වැරැදි ඇතොත් සංශෝධනය කිරීමටත් ඉඩ සලස්වන ලදී අනතුරුව, ලබා දුන් සාක්ෂි නිවැරිදි බවටත්,තේරුම් ගත් බවටත් වන සහතිකය මත සාක්ෂිකරුවන්ගේ අත්සන ලබා ගන්නා ලදී.

# 4. පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව

- **නිරීක්ෂණයන්**

➢ **සංචාරය**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලේකම් වූ මහදූරගේ මොහාන් ඇන්තනි චූලානන්ද ද සිල්වා මහතා ලබා දුන් තොරතුරුවලට අනුව, 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරඟාවලිය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කල ජාතික ක්‍රිකට් කණ්ඩායමට ක්‍රීඩකයින් විසි දෙනෙකු ඇතුළත් වී ඇත. එම නම් ඇමුණුම් අංක: 07 හි සඳහන් වෙයි. මීට අමතරව සහායක කණ්ඩායම ලෙස නිලධාරීන් 13 දෙනෙකු සහභාගි වී ඇත. එම නම් ඇමුණුම් අංක: 08 හි දැක්වේ. මීට අමතරව පස් දෙනෙකුගෙන් සමන්විත වූ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි නිලධාරි මණ්ඩලයද, එකළොස් දෙනෙකුගෙන් සමන්විත වූ විධායක සභිකයින් ද ඕස්ට්‍රේලියාවට යාම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත් බවටද, වරින් වර මේ සියළු දෙනා ම ඕස්ට්‍රේලියාවට ගිය බවටද ප්‍රකාශ කර ඇත. එය සනාථ කිරීම සඳහා ඇමුණුම් අංක: 10 ලකුණු කර ඉදිරිපත් කර ඇත.

කෙසේ වුවද, ඇමුණුම් අංක: 10 හි 12 වන අංකයට සඳහන් කර ඇති ජෙරම් ජයරත්න මහතා විධායක සභිකයෙක් නොවන බවත්, ඔහුව ඕස්ට්‍රේලියානු සංචාරයට ඇතුළත් කරනු ලැබුවේ ඔහු ප්‍රධාන මෙහෙයුම් නිලධාරි නිසා බවත්, ඔහු උසස් කාර්ය සාධනය පිළිබඳ අධීක්ෂණ

මධ්‍යස්ථානයේ ප්‍රධාන නිලධාරි හැටියට කටයුතු කරන නිසා බවටත් ප්‍රකාශ කර ඇත.

මේ අනුව, ඕස්ට්‍රේලියාවේ දී පැවැති 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරඟාවලිය සඳහා පහත නම් දැක්වෙන ක්‍රීඩකයින් ශ්‍රී ලංකාව නියෝජනය කළෝය.

i. දසුන් ශානක (නායක) මහතා ,
ii. පැතුම් නිශ්ශංක මහතා ,
iii. ධනිෂ්ක ගුණතිලක මහතා ,
iv. චරිත් අසලංක මහතා ,
v. කුසල් මෙන්ඩිස් මහතා ,
vi. ධනංජය ද සිල්වා මහතා ,
vii. චාමික කරුණාරත්න මහතා ,
viii. භානුක රාජපක්ෂ මහතා ,
ix. වනිඳු හසරංග මහතා ,
x. මහේෂ් තීක්ෂණ මහතා ,
xi. ජෙෆ්රි වැන්ඩසේ මහතා ,
xii. ප්‍රමෝද් මධුශාන් මහතා ,
xiii. දුෂ්මන්ත චමීර මහතා ,
xiv. දුෂ්මන්ත චමීර වෙනුවෙන් කසුන් රාජිත මහතා ,
xv. ඩිල්ෂාන් මධුශංඛ මහතා ,
xvi. ලහිරු කුමාර මහතා ,
xvii. අෂේන් බණ්ඩාර මහතා ,
xviii. ප්‍රවීන් ජයවික්‍රම මහතා ,
xix. ඩිල්ෂාන් මධුශංක වෙනුවෙන් පසුව බිනුර ප්‍රනාන්දු මහතා ,
xx. බිනුර ප්‍රනාන්දු වෙනුවෙන් අසිත ප්‍රනාන්දු මහතා ,

එසේම, 2022.10.16 වන දින 2022.11.13 වන දින දක්වා අතරතුර කාලයේ දී ඕස්ට්‍රේලියාවේ දී පැවැති 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරඟය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කළ ජාතික ක්‍රිකට් කණ්ඩායමේ සහායක නිලධාරීන් වූයේ,

I. මහින්ද හලංගොඩ (කළමනාකරු) මහතා ,,

II. ක්‍රිස්ටෝෆර් සිල්වර් වුඩ්, (ප්‍රධාන පුහුණුකරු) මහතා ,,

III.මහේල ජයවර්ධන (පුහුණු උපදේශක) මහතා ,,

IV.නවීද් නවාස් (සහාය පුහුණුකරු) මහතා ,

V.දර්ශන ගමගේ (වේග පන්දු පුහුණුකරු) මහතා ,

VI.පියල් විජේතුංග (දඟ පන්දු පුහුණුකරු) මහතා ,

VII.ඇන්ටන් රූක් (පන්දු රැකීමේ පුහුණුකරු) මහතා ,

VIII.බ්‍රෙට් හැරොප් (භෞත චිකිත්සක) මහතා ,

IX.ග්‍රාන්ට් ලූඩන් (පුහුණුකරු) මහතා ,

X.රොහාන් ප්‍රියදර්ශන (සම්භාහක) මහතා ,

XI.ප්‍රතාප් නවරත්නම් (පරිගනක විශ්ලේෂක) මහතා ,,

XII.ප්‍රමෝද්‍යා වික්‍රමසිංහ (තේරීම් කමිටු සභාපති) මහතා ,

XIII.කේ.ඒ. ප්‍රදීප් (වෛද්‍ය) මහතා ,

යන අයවළුන්ය.

2022.10.16 වන දින 2022.11.13 වන දින දක්වා අතර තුර කාලයේ දී ඕස්ට්‍රේලියාවේ දී පැවැති 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට්

තරඟය සඳහා සහභාගි වූ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරි කණ්ඩායම වූයේ,

i. ශම්මි සිල්වා මහතා ,
ii. මොහාන් ද සිල්වා මහතා ,
iii. ඈෂ්ලි ද සිල්වා,
iv. ජයන්ත ධර්මදාස මහතා ,
v. රවීන් වික්‍රමරත්න මහතා ,
vi. ලසන්ත වික්‍රමසිංහ මහතා ,
vii. සුජීව ගොඩලියද්ද මහතා ,
viii. ක්‍රිෂාන්ත කපුවත්ත මහතා ,
ix. ජනක පතිරණ මහතා ,
x. තිලක් වතුහේවා මහතා,
xi. සමන්ත දොඩම්වල මහතා,
xii. ප්‍රියන්ත අල්ගම මහතා ,
xiii. බන්දුල දිසානායක මහතා ,
xiv. රියර් අද්මිරාල් නිශාන්ත ද සිල්වා මහතා ,
xv. නලීන් අපොන්සු මහතා ,
xvi. ජෙරොම් ජයරත්න මහතා ,

ඉහත කී නම් සඳහන් කණ්ඩායම්වලට එරෙහිව විවිධ සමාජ මාධ්‍ය ඔස්සේ සහ පුද්ගලයින් විසින් නඟන ලද ප්‍රසිද්ධ චෝදනා වූයේ,

- ධනිෂ්ක ගුණතිලක විසින් ඕස්ට්‍රේලියාවේ පදිංචි කාන්තාවකට ලිංගික අතවර සිදුකිරීම.
- චාමික කරුණාරත්න විසින් ඕස්ට්‍රේලියාවේ නවාතැන් ගත් හෝටල් කාමරය තුල පහනක් දැල්වීම සහ පුද්ගලයෙකු සමඟ ආරවුල් ඇතිකර ගැනීම සහ ලබා දුන් දඬුවම.
- ක්‍රීඩකයින් කැසිනෝශාලාවලට ගොස් තිබීම.
- ‘බොර්න් අගේන්’ ආගමෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට අනිසි බලපෑම් සිදු වන බව.
- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන් විසින් ආයතනයේ අරමුදල් අවභාවිතා කර ඇති බව

මෙම පංච පුද්ගල මණ්ඩලය ඉදිරියෙහි සාක්ෂි ලබා දුන් සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ මගින් 2022.10.16 වන දින 2022.11.13 වන දින තෙක්, 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරඟාවලිය ඕස්ට්‍රේලියාවේ දී පැවැතුනද, ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම 2022.11.06 වන දින ආපසු ලංකාව බලා පැමිණි බවටද කරුණු අනාවරණය විය.

- **ධනිෂ්ක ගුණතිලක විසින් ඕස්ට්‍රේලියාවේ පදිංචි කාන්තාවකට ලිංගික අතවර සිදුකිරීම**

ඕස්ට්‍රේලියාවේ දී පැවැති 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරඟාවලිය සඳහා ක්‍රීඩකයෙකු ලෙසට සහභාගි වූ **ධනිෂ්ක ගුණතිලක** විසින් ඕස්ට්‍රේලියාවේ පදිංචි **කාන්තාවකට ලිංගික අතවර සිදු කිරීමේ** චෝදනාවකට ලක්වීම මත, එරට අධිකරණ නියෝගයක් මත, එරටේම රඳවාගෙන ඇති බවට අණාවරනය විය.

**ජාතික ක්‍රිකට් කණ්ඩායමේ කළමනාකරු වශයෙන් කටයුතු කරන මහින්ද බන්දුල හලංගොඩ** මහතාගේ ප්‍රකාශයට අනුව, ක්‍රීඩකයින්ට රාත්‍රී 11.45 නවාතැනට පැමිණිය යුතුව තිබූනද, තරඟ නිමවා ආපසු හෝටලයට පැමිණීම ප්‍රමාද වූ හෙයින්, ප්‍රමාද වී පැමිණීමට අවස්ථා දෙකක් ලබා දී ඇත. එහිදී මෙම කාලය රාත්‍රී 1.00 දක්වා සහ රාත්‍රී 2.00 දක්වා දීර්ඝ කර ඇත. මේ කාලය තුළ දී, **ධනිෂ්ක ගුණතිලක** තනිවම ගොස් මෙම සිද්ධියට සම්බන්ධ වී ඇති බවට දැන ගන්න ලැබී ඇත.

## ➢ චාමික කරුණාරත්න විසින් ඕස්ට්‍රේලියාවේ නවාතැන් ගත් හෝටල් කාමරය තුළ පහනක් දැල්වීම

ඕස්ට්‍රේලියාවේ දී පැවැති 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරඟාවලිය අතර තුරදී, ශ්‍රී ලංකාව සුදුසුකම් ලැබීම සඳහා නෙදර්ලන්තය සමග පැවැත්වීමට නියමිතව තිබූ තරඟයට පිටත්ව යෑමට සුළු මොහොතකට පෙර, තරඟයෙහි ජයග්‍රහණය පතා, ඕස්ට්‍රේලියාවේ නවාතැන් ගත් හෝටල් කාමරය තුල බුදු රජාණන් වහන්සේ වෙනුවෙන් **චාමික කරුණාරත්න** විසින් පහනක් දල්වා ඇත. ඔහු විසින් එසේ එම පහන දල්වා තිබුනේ, පෙර දිනයක දල්වා තිබූ පහනක් සහ වෙනත් ස්ථානවල වීසි කර තිබූ දුම්වැටි වල කොටස් දුටු හෝටලේ කළමණාකරු විසින්, එම ක්‍රියාවන් අන්තරාදායක බවට ලිඛිතව කර තිබූ දැනුම් දීමකට අනුව, ක්‍රිකට් කළමනාකරු විසින් පහන් නොදල්වන ලෙස අවවාද කිරීමක් සිදු කර තිබූ අවස්ථාවකදිය.

කෙසේ වුවද, චාමික කරුණාරත්නගේ හිතේ තිබූ තදබල විශ්වාසය සහ පහන නිව්වොත් තරඟය පැරදෙයි කියා ඇතිවූ බයට, “Do not disturb” යන පුවරුව දොරේ එල්ලා ඇත. එනමුදු පහන නිසා අනතුරක් වීම වලක්වා ගැනීම පිණිස තෙත තුවායක් මත එම පහන තබා තිබූ බවටද චාමික කරුණාරත්න විසින් පවසා ඇත.මෙම අවස්ථාවේ දි කළමනාකරු විසින් කාමරය පරීක්ෂා කර, පහන් දැල්වීමේ වරදට දඬුවමක් ලෙස

ඕස්ට්‍රේලියානු ඩොලර් 1000 ක දඩයක් චාමික කරුණාරත්නට ඕස්ට්‍රේලියාවේ දීම ගෙවීමට නියම කර ඇත.

කෙසේ වුවද, චාමික කරුණාරත්න ශ්‍රී ලංකාවට පැමිණි පසුව ද, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ද ත්‍රි පුද්ගල කමිටුවක් පත් කර, කමිටුව ලබා දුන් නිර්දේශ මත සහ විධායක කමිටුවේ තීරණය මත, අන්තරාදායක තත්වයකට පත්කරමින් නවාතැන් ගත් හෝටල් කාමරය තුල පහනක් දල්වා තිබීමත්,කැසිනෝ ශාලාවකට ගොස් වෙනත් පුද්ගලයෙකු සමඟින් සිදු කල බහින්බස් වීමටත් දඬුවමක් ලෙසට අත්හිටවූ තරඟ තහනමක් සහ අමෙරිකානු ඩොලර් 5000 ක් වැනි දඩ මුදලක් ගෙවීමට නියම කර ඇත.

**ජාතික ක්‍රිකට් කණ්ඩායමේ කළමනාකරු වශයෙන් කටයුතු කරන මහින්ද බන්දුල හලංගොඩ** මහතාගේ ප්‍රකාශයට අනුව, ක්‍රීඩකයෙකුට දඬුවම් දී ඇති අවස්ථාවක, නැවත වරක් එම ක්‍රීඩකයාට ක්‍රිකට් ආයතනය විසින් ද දඬුවම් ලබා දී ඇති බවට මීට පෙර නිරීක්ෂණය කර නොමැත.

- **චාමික කරුණාරත්න ක්‍රීඩකයා පුද්ගලයෙකු සමඟ ඇති කරගත් ආරවුල**

චාමික කරුණාරත්න ක්‍රීඩකයා පමණක් නොව, ක්‍රිකට් කණ්ඩායමේ තවත් ක්‍රීඩකයින් කිහිප දෙනෙකුත් කැසිනෝ ශාලාවකට ගොස් තිබූ

අවස්ථාවකදී, , වෙනත් පුද්ගලයෙකු එම ස්ථානයට පැමිණ ලබා ගත් ඡායාරූපයක් කපා හරින ලෙසට ඉල්ලමින් චාමික කරුණාරත්න ක්‍රීඩකයා ඉහත පුද්ගලයා සමඟින් බහින්බස් වීමක් පමණක් සිදුවී තිබූ බවටත්, අවසානයේදි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් එය විමසීමට ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර, ඒ සඳහා චාමික කරුණාරත්නට දඩුවමක් ලබා දී තිබූ බවටත් අනාවරණය වෙයි. කෙසේ වුවද, අනිකුත් ක්‍රීඩකයින් කැසිනෝ ශාලාවට ගොස් කළ ක්‍රියාවන් සම්බන්ධව විමසීමක් කළ බව හෝ ඊට අදාලව යම් ක්‍රියාමාර්ගයක් ගෙන තිබු බවට හෝ කිසිදු කරුණක් අනාවරණය නොවෙයි.

**ජාතික ක්‍රිකට් කණ්ඩායමේ කළමනාකරු වශයෙන් කටයුතු කරන මහින්ද බන්දුල හලංගොඩ** මහතාගේ ප්‍රකාශයට අනුව, රාත්‍රී 8.00, 8.30 න් පසු සියළු ම අවන්හල් වසන අතර, ක්‍රීඩකයන්ට ආහාරපාන ගැනීම සඳහා ඕස්ට්‍රේලියාවේ විවෘත තිබෙන්නේ කැසිනෝ ශාලා පමණකි. ක්‍රීඩකයන් කැසිනෝ ශාලාවලට ගොස් ක්‍රීඩා කිරීම විනය විරෝධීය.

## ➢ 'බොර්න් අගේන්' ආගමෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට වන බලපෑම්

- 'බෝන් අගේන්' අනුගාමිකයන් ක්‍රිකට් ක්‍රීඩාවට ඇතුල් වී හානි සිදු වන බවට රාවයක් පවතින බවටද, පාස්ටර් කෙනෙක් විසින් ක්‍රීඩකයෙක් තුවාල වී ක්‍රීඩා පිටියෙන් ඉවතට එන බවට පවසා තිබියදී, බිනුර ප්‍රනාන්දු යන ක්‍රීඩකයා ඒ ආකාරයෙන් ම කකුල අල්ලා ක්‍රීඩා පිටියෙන් ඉවත් වී තිබූ බවද, ක්‍රිකට් ක්‍රීඩාව සඳහා ඇතුල් වීමට ඇති පහසු ම ක්‍රමය මෙම ආගම වැළඳ ගැනීම බවට මතයක් පවතින බවටද, නිහඬව හිටියොත් තවත් පුළුල් විය හැකි බවටද අර්ජුන රණතුංග මහතා පවසා ඇත.
- **'ෆෙඩ්රික් ක්‍රිස්ටෝපර් ජෙරොම් ප්‍රනාන්දු'** නැමැති 'බෝර්න් අගේන්' ආගමික, නායකවරයා විසින් මෙම මණ්ඩලය ඉදිරියෙහි ප්‍රකාශයක් ලබාදෙමින්, ඔහු දිවැසිවරයෙකු වන බවටත්, 'ජේසුස් ක්‍රිස්තුත් වහන්සේ' විසින් ලබා දුන් ආත්මයක් උපයෝගී කර ගෙන දුකට සහ ආබාධයන්ට පත් වූ බොහෝ පිරිසකට කායික සහ මානසික සුවය ලබා දෙමින් කටයුතු කරන බවටත් , එනමුදු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටු නිලධාරීන්ගෙන් යමෙකු අනුගාමිකයන් වශයෙන් ඔහුට මුහුණට මුහුණ හමු වී නැති බවත්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයත් සමග හෝ ක්‍රිකට් ආයතනයේ සිටින නිලධාරීන් සමඟ කිසිම සම්බන්ධතාවයක් නොමැති, මුත් දේව යාඥාවලට ඔවුන් පැමිණ සිටියා ද කියා

නොදන්නා බවටත් **ශ්‍රී ලංකා ක්‍රිකට්වලට සම්බන්ධ කිසිවෙකු සත්‍ය වශයෙන් ම ඔහුගේ පිහිට පතා පැමිණ නොමැති බවටත්** පවසා ඇත.

- එනමුදු, තවත් වරෙක, **ක්‍රිකට් ක්‍රීඩාවට සම්බන්ධව තම දේවස්ථානයේ සාමාජිකත්වය ගත් අනුගාමිකයන් හත් දෙනෙක් පමණ සිටින බවටත්, රුවන් කල්පගේ, භානුක රාජපක්ෂ, වැන්ඩර්සෙ, ලින්ඩන් හැනිබල්, රොෂාන් අබේසිංහ වගේ අය එහි සාමාජිකයින් වන බවටත් ,** කුමාර් සංගක්කාර මුලින් සිටිය ද දැන් නොමැති බවටත් **පැහැදිලිවම පවසා ඇත.**
- **ඒ අනුව , ශ්‍රී ලංකා ක්‍රිකට්වලට සම්බන්ධ අයවළුන් ඔහුගේ පිහිට පතා පැමිණ නොමැති බවට කරනු ලබන ප්‍රකාශය සම්පූර්ණයෙන්ම පරස්පර විරෝධියය.**

- මේ අනුව ක්‍රිකට් ක්‍රීඩාවට සම්බන්ධ **'බෝර්න් අගේන්'** අනුගාමිකයින් සම්බන්ධව මෙම සාක්ෂිකරු සත්‍ය කරුණු වසන් කරමින් සාක්ෂි ලබා දෙන බවට පැහැදිලිවම අනාවරණය වන හෙයින්, මෙම ආගමික නායකවරයා ක්‍රියා කරන්නේ තවදුරටත් **ක්‍රිකට් ක්‍රීඩාවට සම්බන්ධ** අනුගාමිකයින්ව තම වසඟයේ තබාගනිමින් ආරක්ෂා කර ගැනීම සඳහා සාධාරණව සිතෙන යමෙකුට නිගමණය කල හැක.
- තවද, ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයන්ට තුවාල සිදු වන බවට අනාවැකි පල කර ඇති බවත්, එසේ අනාවැකි පළ කිරීමට

ශක්තිය ලැබුනේ දිවැසිවරයෙක් හැටියට ඔහුට දේව හඬ ඇසෙන නිසා බවටත් පවසා සිටියද, 'ඔබතුමාට තිබෙන ආත්මික බලයත් සමග මීළඟ ලෝක කුසලාන ක්‍රිකට් තරඟයේ දී ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම දිනවීමට හැකියාවක් පවතිනවාද' යනුවෙන් කමිටුව විමසූ ප්‍රශ්නයට, ''මම දිවැසි වාක්‍යයක් කියන කොට එහි මූලාශ්‍රය මම නොවන නිසාත්, මට හම්බ වෙන්නේත් පණිවුඩයක් නිසාත් මට ලැබෙන දේව අණ අනුව පමණක් මම ක්‍රියාත්මක වන නිසාත් මට ස්වාධීනව ක්‍රියා කළ නොහැකියි. '' යනුවෙන් පමණක් නොව, දෙවියන් වහන්සේ විසින් පණිවුඩයක් ලබා දුනහොත් පමණක් පුද්ගලයෙකුට උදව්වක් කරන්න හැකි බවත්, ඒ අනුව දෙවියන් වහන්සේ විසින් යමෙකුට උදව්වක් කරන ලෙසට පණිවුඩයක් නොදුන්නහොත් ඒ පුද්ගලයාට උදව්වක් කිරීමට හැකියාවක් නොමැති බවටත්, එබඳු අවස්ථාවක යමෙකුට පිහිට වන්නේ ඔහු වටා සිටින පිරිසගෙන් උදව් ලබානිමින් යැයි බවටත්, පැහැදිලිවම පවසා ඇත. එහෙයින් 'බෝර්න් අගේන්'ආගමේ සාමාජිකයෙකු හෝ අනුගාමිකයෙකු වීම / ඇදහීම තුලින් , යම් තැනැත්තෙකුට නියත වශයෙන්ම කායික සහ/හෝ මානසික සුවය අත්පත්කර ගත නොහැකි බවට නිරීක්ෂණය වේ.

- එසේම, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි ඈෂ්ලි ද සිල්වා මහතා විසින් ඕස්ට්‍රේලියාවේ පැවැති ටී. 20 ලෝක කුසලාන තරඟාවලිය සඳහා සහභාගිවූ දූෂ්මන්ත චමීර සහ බිනුර ප්‍රනාන්දු යන ක්‍රීඩකයින් දෙදෙනාට අවුරුදු දෙකක කාලයක් තිස්සේ බරපතල

ආබාධ තිබී ඇති මුත් (එක්කෙනෙකුට වළලුකරෙහි ආබාධයක් සහ අනෙක් අයට කකුලෙහි මස් පිඩු වේදනා) ශාරීරික යෝග්‍යතා කළමනාකරණය කරමින් ටී.20 ලෝක කුසලාන තරඟාවලියට සහභාගි කල බවට පවසා ඇත. ඒ අනුව, බිනුර ප්‍රනාන්දු යන ක්‍රීඩකයා ක්‍රීඩා පිටියේදි තුවාල වන බවට කරනු ලබන අනාවැකිය , පුදුමයට කරුණක් නොවේ.

- 'බෝර්න් අගේන්' ආගමේ පාස්ටර් ටෙරී, **'චාමික කරුණාරත්න' ක්‍රීඩකයාව** මුණ ගැසී 'බෝර්න් අගේන්' ආගමේ වැදගත්කම පවසා තිබූ බවට අණාවරණය විය.
- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලේකම් මොහාන් ද සිල්වා මහතා ලබා දුන් ප්‍රකාශයෙන් ,'බෝර්න් අගේන්' ආගමට සම්බන්ධ ක්‍රීඩකයන් කිහිප දෙනෙක් සිටින බව පිළිගනී. තවද, 'පාස්ටර් ජෙරොම්' විසින් ආසියානු කුසලානය දිනන බවට සහ ඊට විශේෂ දායකත්වයක් 'භානුකගෙන් ලැබෙන' බවටත්, ක්‍රීඩකයන් ක්‍රීඩා කරන අවස්ථාවේ දී ඇති වන ආබාධ පිළිබඳව පුරෝකථනයක් කර ඇති බවටත්, වන කරුණු මත ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් විමර්ශනයක් ආරම්භකිරීමට නියමිත බවටත් අනාවරණය විය.එසේ වුවද, ඈෂ්ලි ද සිල්වා මහතා පවසන්නේ එබඳු කථාබහක් ක්‍රිකට් ආයතනය තුල සිදු නොවූ බවයි.
- **ජාතික ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයෙක් වූ මැස්ටියගේ දොන් ධනිෂ්ක ගුණතිලක** 'බෝර්න් එගේන්' ආගමේ එක ක්‍රීඩකයෙක් සම්බන්ධවත් ඔහුට දැනීමක් නොමැති බවට පවසද්දි, **ප්‍රමෝද් භානුක බණ්ඩාර**

**රාජපක්ෂ නැමැති ක්‍රීඩකයා විසින් නොබියවම** ඔහු උපතින් බුද්ධාගම වැළඳ ගෙන සිටියද, 2015 අවසාන භාගයේ සිට 'බෝර්න් එගේන්' ආගමේ අනුගාමිකයෙක් බවට පවසා ඇත.

- මේ හැරෙන්නට, ක්‍රිකට් ක්‍රීඩක ජෙෆ්රි වැන්ඩසෙ, සදීර සමරවික්‍රම සහ ක්‍රිකට් පුහුණුකරු රුවන් කල්පගේ, ක්‍රිකට් විනිසුරුවරුන් වන ලින්ඩන් හැනිබල් සහ ක්‍රිකට් විචාරක රොෂාන් අබේසිංහ ද 'බෝර්න් අගේන්' ආගම වැළඳ ගත් අයවළුන් වන බවද, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන් වූ ඇෂ්ලි ද සිල්වා මහතාත්, ජෙරම් ජයරත්න මහතාත් 'බෝර්න් අගේන්' අනුගාමිකයන් බවට ප්‍රසිද්ධ කරුණක් වන බවට ද, ජාතික ක්‍රිකට් ක්‍රීඩාවට යම් ආකාරයක බලපෑමක් සිදු වූවාද යන්න නොදන්නා මුත්, ප්‍රශ්න තියෙන අය සොයා බලා උපකාර කිරීමේ මුවාවෙන් ඒ අයව අනුගාමිකයන් බවට පත් කර ගැනීමට උත්සාහ දරන බවට ද සාක්ෂි ඉදිරිපත් වී ඇත .
- ඉදිරිපත් වූ සියළු කරුණු සලකා බැලීමේදී, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සහ ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායම තුල සිටින බෝර්න් අගේන්' සාමාජිකයින් සහ/හෝ අනුගාමිකයින් සම්බන්ධව සාක්ෂිකරුවන්, සත්‍ය සාක්ෂි ලබාදීම සහ/හෝ නිවැරිදි කරුණු අනාවරණය කිරීම , සිදු නොකළ බවත්, විශේෂයෙන් තම අනාගතයට යම් බලපෑමක් වෙතැයි යන බිය මත, මීට අදාලව ඇතැම් ක්‍රීඩකයින් සාක්ෂි දීමෙන් වැළකී සිටිය බවටත්, **එබැවින්'බොර්න් අගේන්' ආගම හේතුවෙන්, ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට යම් බලපෑමක් සිදු වී ඇත්ද යන්න නිශ්චිතවම නිගමණය කල නොහැකිවුව ද, ඒ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කළ යුතු බවටත්, එසේ සිදු නොකළහොත්,ඉදිරියේදි බලපෑම් සිදු වීමට ඉඩ ඇති බවටත්** නිරීක්ෂණය කරන ලදි.

- **ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන් විසින් ආයතනයේ අරමුදල් අවභාවිතා කර ඇති බව**

  - ඕස්ට්‍රේලියාවේ දී පැවැති 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරඟාවලිය අතරතුරදී රාජ්‍ය නොවන සංවිධාන, මගින් හෝ ක්‍රිකට් ක්‍රීඩකයන් සමග ඡායාරූප ගැනීම මගින් හෝ ආධාර එකතු කර තිබූ බවට කිසිදු කරුණක් අනාවරණය නොවිණි.
  - එසේ වුවද, ඕස්ට්‍රේලියාවේ දී පැවැති 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරඟාවලියට උපහාර පිදීම වෙනුවෙන් ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර දී 2022.10.11 වන දින ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සූදානම් කර තිබූ නිල උත්සවය සඳහා පිළියෙල කල රාත්‍රී භෝජන සංග්‍රහයේදි , 'ශ්‍රී ලංකා ක්‍රිකට් නියෝජිත' වශයෙන් හැඳින්වූ 'මලික් ෂවීර්' යන අය විසින් ප්‍රවේශ පත්‍ර අලෙවි කිරීමක් සිදු කර තිබුනු බවත්, එනමුදු, ඉන් ලැබුණු ආදායම් සම්බන්ධයෙන් වූ ගිණුම් එකී 'මලික් ෂවීර්' විසින් මෙතෙක් ලබා දී නොමැති බවටත්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලේකම්, මොහාන් ද සිල්වා ලබා දුන් සාක්ෂි මගින් කරුණු අනාවරණය විය.
  - තවද, පිති සහ සමරු වෙන්දේසි කොට ද මුදල් රැස් කර තිබූ බවට ද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන විධායක නිළධාරි ඇෂ්ලි ද සිල්වා ලබා දුන් සාක්ෂි මගින් අනාවරණය විය.
  - ක්‍රීඩකයින්ගේ පුහුණු උපදේශක වරයෙකු වශයෙන් ක්‍රිකට් ආයතනයේ වියදමින් ඕස්ට්‍රේලියාවට ගොස් තිබූ **මහේල ජයවර්ධන**

විසින් 'මිනිස්ට්‍රි ඔෆ් ක්‍රැබ්ස්' නම් අවන්හල විවෘත කර තිබූ බවටත් අනාවරණය විය.

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වියදමින් නිලධාරීන් පස් දෙනෙකු සහ විධායක කමිටුවට සම්බන්ධ නිලධාරීන් දහ දෙනෙකුද (ප්‍රමෝදය වික්‍රමසිංහ හැරෙන්නට), තවත් නිළධාරියෙකුද මුළු එකතුව, **දහසය දෙනෙකු** තරඟ සංචාර සඳහා සහභාගි වී තිබූ බවටත්, ඔවුන්ගේ ගුවන් ගමන් ටිකට් පත්‍ර මිලදී ගැනීම සඳහා රුපියල් 25,687,498/-ක් ද (ජෙරොම් ජයරත්න මහතාගේ වියදම හැර) අනිකුත් වියදම් සඳහා **ඇමෙරිකානු ඩොලර්** 1,07,800 ක් ද, වැය කර තිබූ බවට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති ලබා දුන් **"y"** ඇමුණුමට අනුව කරුණු අනාවරණය වෙයි.
- ඇමුණුම් අංක: 10 හි සඳහන් පරිදි,ඉහත වියදම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් දරා තිබුනේ, මෙම නිලධාරීන් 16 දෙනාට , 'ඕස්ට්‍රේලියා ගමන සඳහා වන වියදම් අවම මට්ටමකින් පවත්වන ලෙසට' ක්‍රීඩා හා යෞවන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලේකම්වරයාට දැනුම් දී ඇති අවස්ථාවකදීය.
- එසේ වුවද, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති ශම්මි සිල්වා මහතාගේ මතය වන්නේ, ප්‍රධාන විධායක නිලධාරි හැරෙන්නට විධායක කමිටු නිලධාරීන් ගරු සේවයක් කරන බැවින් ඒ අයට තරඟ නැරඹීමට අවස්ථාවක් ලබා දිය යුතු බවයි. ප්‍රධාන විධායක නිලධාරි ඈෂ්ලි ද සිල්වා ගේ මතය වන්නේද, විධායක සභිකයින් ගරු සේවයක් කරන හෙයින් සහ

සාමාන්‍යයෙන් ලෝක කුසලාන තරඟයක් අවුරුදු දෙකකට වතාවක් ලැබෙන බැවින්, නිලධාරීන් යා යුතු බවයි.

**මෙහිදී,**

- ජෙරොම් ජයරත්න මහතා ඕස්ට්‍රේලියාවට ගියේ, උසස් කාර්ය සාධන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීම සහ තරඟ නැරඹීම සඳහා යැයි  ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති ශම්මි සිල්වා පවසා තිබුනද, ජෙරොම් ජයරත්න මහතා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ එම තනතුර නොදරන බවත්, ඔහු ශ්‍රී ලංකා ක්‍රිකට් ප්‍රධාන මෙහෙයුම් නිලධාරි පමණක් වන බවටත් කරුණු අනාවරණය විය. එබැවින් සභාපති ශම්මි සිල්වා මහතා අසත්‍යයක් පවසා ඇති බවට නිරීක්ෂණය වෙයි.
- **තවද, ජෙරොම්  ජයරත්න** මහතාගේ  ප්‍රකාශයට අනුව, 2022 ජනවාරි මාසයට පසුව, ජාත්‍යන්තර තරඟවලට සහභාගි වන ක්‍රීඩකයන්ගේ ශාරීරික යෝග්‍යතා සහ කුසලතා සම්බන්ධව (තේරීම් කමිටුවට වාර්තා යැවීම වැනි)  කිසිඳු රාජකාරි කටයුත්තක් ඔහු  සිදු කර නැත. ක්‍රිකට් ක්‍රීඩාව ප්‍රචලිත කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ඔහු සිදු කලද,  ඒ සඳහා විදේශගත වීමක් අවශ්‍ය නොවේ. ඒවා සිදු කරන්නේ ඊ-තැපැල මාර්ගයෙන් හෝ දුරකථන මාර්ගයෙනි. තවද, 2022 ටී.20 ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලිය සඳහා ප්‍රචාරක වැඩ සටහනක්  දියත් කලද, 2022 ටී.20 ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලිය අතරතුර දී ඔහුගේ රාජකාරිය සිදු කර අවසන් වී ඇත.

- එනමුත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටුව විසින් ගත් තීරණයක් අනුව,ඔහු දින 10ක් ඕස්ට්‍රේලියාවේ සංචාරය කර ඇත. ඔක්තෝබර් මස 26 වන දින ගොස් නැවත දිවයිනට පැමිණ ඇත්තේ නොවැම්බර් මස 08 හෝ 09 වන දිනය. නවාතැන් ගෙන ඇත්තේ ඔහුගේ සොහොයුරියගේ නිවසේය. සංචාරය පුරාවටම ඔහු කිසිදු රාජකාරි කටයුත්තක යෙදී නැත. ක්‍රිකට් ක්‍රීඩාව කිසිදු දායකත්වයක් තිබී නැත. එනමුදු , ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් වීසා ලබා ගැනීම සඳහා සහ ගුවන් ගමන් වියදම් අමතරව, දෛනික දීමනා වශයෙන් ද, අමෙරිකානු ඩොලර් 700 බැගින් දින 10කට ඩොලර් 7000ක් ලබා දී ඇත.
- **ජාතික ක්‍රිකට් කණ්ඩායමේ කළමනාකරු වශයෙන් කටයුතු කරන මහින්ද බන්දුල හලංගොඩ** මහතාට අනුව, 2022 ටී 20 ලෝක කුසලාන තරඟාවලියේ දී ශ්‍රී ලංකාවට තරඟ අටක් තිබී ඇත. ක්‍රිකට් තරඟාවලි නැරඹීම සඳහා පැමිණෙන අයෙකුට ප්‍රවේශ පත්‍රයක් තිබීම අනිවාර්ය වෙයි. ඔහු ගේ මතකයට අනුව, ඔහුට ලැබුණු ටිකට් වලින් ඇෂ්ලි සිල්වා මහතාට තරඟ තුන, හතරකට ද, චින්තක එදිරිමාන්න මහතාටත්, සුජීව ගොඩලියද්ද මහතාටත් සහ රවීන් මහතාටත් එක තරඟයක් සඳහා ද ටිකට් ලබා දීඇත. ජයන්ත ධර්මදාස මහතාටද එක තරඟයකට හෝ දෙකකට ටිකට් ලබා දී ඇත. නලින් අපොන්සු මහතා, තිලක් වත්තුහේවා මහතා සහ නිශාන්ත ද සිල්වා නොහඳුනයි. ජෙරම් ජයරත්නව මහතා ව දැක නැත. ප්‍රියන්ත අල්ගම මහතා සමග කථා කර ඇත. ටිකට් ඉල්ලුවේ තරඟ කීයකට ද කියා මතක නැත. ජානක පතිරණ

මහතා, ක්‍රිශාන්ත මහතා, සහ ලසන්ත වික්‍රමසිංහ මහතා හඳුනයි. ඔහුට කථා කර නැත. ශම්මි සිල්වා මහතා හඳුනන මුත් කථා කර නැත. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම 2022.11.06 / 07 වන දින ආපසු ලංකාව බලා පැමිණ ඇත.

එහිදී,

- අයි.සී.සී. ආයතනය විසින් කළ ආරාධනයක් පරිදි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ භාණ්ඩාගාරික, ලියනගේ ලසන්ත සදානන්ද වික්‍රමසිංහ මහතා 2022 නොවැම්බර් 13, 14 සහ 15 යන දිනවල පැවති මූල්‍ය ප්‍රධානීන්ගේ කමිටු රැස්වීමට සහභාගි සඳහා, 2022 ටී.20 ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලිය අතරතුරදී ඔස්ට්‍රේලියාවට ගොස් තිබුනද, ඔහු ශ්‍රී ලංකාවෙන් පිටව ගොස් ඇත්තේ 2022 නොවැම්බර් 04 වන දිනය. ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලිය සඳහා අයි.සී.සී. ආයතනය විසින් කල ආරාධනය තහවුරු කිරීමට ‘A’ වශයෙන් සලකුණු කල ලේඛනයට අනුව, මූල්‍ය ප්‍රධානීන්ගේ කමිටු රැස්වීම පවත්වා ඇත්තේ 2022 නොවැම්බර් 14 සහ 15 යන දිනවල පමණි. මේ අනුව, මෙම නිලධාරියා මූල්‍ය ප්‍රධානීන්ගේ කමිටු රැස්වීම ඇරඹීමට දින 10 කට ප්‍රථම ඔස්ට්‍රේලියාවට ගොස් තිබූ බවට පැහැදිලිය.
- තවද, ලියනගේ ලසන්ත සදානන්ද වික්‍රමසිංහ මහතා **ගේ ප්‍රකාශයට අනුව, එහිදී තරඟ තිබුනේ එක් තරඟයක් පමණකි. එනමුදු,** ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති ලබා දුන් “y” ඇමතුමට අනුව,

ඉහත නිළධාරියා ශ්‍රී ලංකාව සමඟින් පැවති තරඟ 2 ක් හා තවත් තරඟයක් නරඹා ඇත. තරඟාවලි දින දැක්වෙන, ඇමුණුම් අංක 14ට අනුව, නොවැම්බර් 05 වන දිනට පසුව ශ්‍රී ලංකාව සමඟින් එකදු හෝ තරඟයක් තිබී නැත. ශ්‍රී ලංකාව නියෝජනය කල කණ්ඩායම නොවැම්බර් 06 වන දින ඔස්ට්‍රේලියාවෙන් පිට වී, නොවැම්බර් 07 වන දින ශ්‍රී ලංකාවට පැමිණ ද ඇත.

- එසේම, මෙම නිළධාරියා ලබා ගත්තේ ව්‍යාපාරික පංතියේ ප්‍රවේශ පත්‍රයක් බවට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති පැවසුවත්, මෙම නිළධාරියා විසින් තමන් ගියේ , පළමු පන්තියේ ගුවන් ගමන් ප්‍රවේශ පත්‍රයක් මගින් බවට පවසා ඇත.
- **මේ අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපතිවරයා විසින් මෙම මණ්ඩලයට අසත්‍ය කරුණු අඩංගු වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවට පැහැදිලිය.**
- **එසේම** ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ භාණ්ඩාගාරික වූ ලියනගේ ලසන්ත සදානන්ද වික්‍රමසිංහ නැමැත්තා කිසිදු මූල්‍යමය ගෙවීමක් ලබා නොගෙන ඔහු ගරු සේවයක් කරන බවට පැවසුවත්, 2022 නොවැම්බර් 14 සහ 15 යන දිනවල පැවති **මූල්‍ය ප්‍රධානීන්ගේ කමිටු රැස්වීමට සහභාගී වීම සඳහා ගොස් තිබුනේ , ඊට දින 10 කට කලින් බවටත් , එහිදී නරඹා තිබුනේ එක් තරඟයක් පමණක් බවට ඔහු ලබා දුන් ප්‍රකාශය මගින්ම කරුණු අනාවරණය වන හෙයින්, මෙම තරඟය වෙනුවෙන් අති විශාල මුදලක් ඔහුට වැය කර තිබූ බවට ද පැහැදිලිය.** ඉහත කී "y" ඇමනුමට අනුව, ඇමෙරිකානු

ඩොලර් 7000 ක් එදිනෙදා වියදම් සඳහාද, ගුවන් ගමන් සඳහා ලංකා මුදලින් රුපියල් 1,650,000.00 ක්ද ගෙවා ඇත.

- **තවද,** ඔහු ගරු සේවයක් කරන බවට පැවසුවත්, ක්‍රිකට් ආයතනය මගින් ඔහුට රියදුරෙක් සමග වාහනයක් ගිය වසරේ සිට සංචිතයෙන් ලබා දී ඇත. දේශීය සහ විදේශීය තරඟ නැරඹීම සඳහා ද පහසුකම් ලබාගනී.

**මේ හැරෙන්නට,**

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපතිවරයා විසින් මෙම මණ්ඩලයට සපයන ලද ඉහත කී "y" ඇමුනුමට අනුව, තිලක් වත්තුහේවා සහ නලින් අපොන්සු යන දෙදෙනා 2022 නොවැම්බර් 04 වන දින සිට 2022 නොවැම්බර් 14 වන දින දක්වා ඔස්ට්‍රලියාවේ සිට ඇති අතර, එංගලන්තය - ශ්‍රී ලංකාව, ඇෆ්ගන් - ශ්‍රී ලංකාව සහ එංගලන්තය- පකිස්ථානය තරඟ නරඹා ඇත. එනමුදු, තරඟාවලි දින දැක්වෙන, ඇමුණුම් අංක 14 ට අනුව, ඇෆ්ගන්- ශ්‍රී ලංකාව තරඟය තිබී ඇත්තේ නොවැම්බර් 01 වන දිනය. එනයින්ම මෙම වාර්තාව බැලූ බැල්මටම අසත්‍ය වාර්තාවක් වන බවට පැහැදිලි වන හෙයින් , ඉහත කී ' "y" ඇමුනුම',**ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන් විසින්, ආයතනයේ අරමුදල් අවභාවිතා කර ඇති අන්දම වසන් කිරීම පිණිස සකසන ලද ලේඛනයක්** ලෙස සලකා බැලිය යුතුව ඇත.

- එපමණක්ද නොව, ඉහත කී "y" ඇමුනුමට අනුව,

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපතිවරයා ඔස්ට්‍රේලියාවේ සිටි කාලය වන්නේ 2022 ඔක්තෝම්බර් 08 වන දින සිට 2022 ඔක්තෝම්බර්

17 වන දින තෙක්ය. එසේ ඔහු ඔස්ට්‍රලියාවේ සිටි කාලය තුල නැම්බියාව -ශ්‍රී ලංකාව, ඇෆ්ගන්- ශ්‍රී ලංකාව, සහ එංගලන්තය - ශ්‍රී ලංකාව, යන තරග 3 නරඹා ඇත. එනමුදු, තරඟාවලි දින දැක්වෙන, ඇමුණුම් අංක 14 ට අනුව, ඇෆ්ගන්- ශ්‍රී ලංකාව තරඟය තිබී ඇත්තේ නොවැම්බර් 01 වන දිනය. එංගලන්තය-ශ්‍රී ලංකාව තරඟය තිබී ඇත්තේ නොවැම්බර් 05 වන දිනයය. ඒ අනුව, ඔහුට නොවැම්බර් 05 වන දින පැවති තරඟයට සහභාගි වීමට හැකියාවක් නොතිබූ බවට පැහැදිලිය.

- උප සභාපති වූ ජයන්ත ධර්මදාස මහතා ඔස්ට්‍රේලියාවේ සිටි කාලය වන්නේ 2022 ඔක්තෝම්බර් 22 වන දින සිට 2022 නොවැම්බර් 02 වන දින තෙක්ය. එසේ ඔහු ඔස්ට්‍රලියාවේ සිටි කාලය තුල එංගලන්තය-ශ්‍රී ලංකාව, නවසීලන්තය -ශ්‍රී ලංකාව, සහ ඇෆ්ගන්- ශ්‍රී ලංකාව, යන තරග 3 නරඹා ඇත. එනමුදු, තරඟාවලි දින දැක්වෙන, ඇමුණුම් අංක 14 ට අනුව, එංගලන්තය-ශ්‍රී ලංකාව තරඟය තිබී ඇත්තේ නොවැම්බර් 05 වන දිනයය. ඒ අනුව, ඔහුට ද නොවැම්බර් 05 වන දින පැවති තරඟයට සහභාගි වීමට හැකියාවක් නොතිබූ බවට පැහැදිලිය.
- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී, ඇශ්ලි ද සිල්වා මහතා ඔස්ට්‍රේලියාවේ සිටි කාලය වන්නේ 2022 ඔක්තෝම්බර් 09 වන දින සිට 2022 ඔක්තෝම්බර් 17 වන දින තෙක්ය. එසේ ඔහු ඔස්ට්‍රලියාවේ සිටි කාලය තුල එංගලන්තය-ශ්‍රී ලංකාව, ඇෆ්ගන්- ශ්‍රී ලංකාව, යූඒඉ-ශ්‍රී ලංකාව, සහ එංගලන්තය-පකිස්ථානය යන තරඟ

4 නරඹා ඇත. එනමුදු, තරඟාවලි දින දැක්වෙන, ඇමුණුම් අංක 14 ට අනුව, එංගලන්තය-ශ්‍රී ලංකාව තරඟය තිබී ඇත්තේ නොවැම්බර් 05 වන දිනයය. ඇෆ්ගන්- ශ්‍රී ලංකාව තරඟය තිබී ඇත්තේ නොවැම්බර් 01 වන දිනයය. යූඒඉ-ශ්‍රී ලංකාව තරඟය තිබී ඇත්තේ ඔක්තෝම්බර් 18 වන දිනයය. එංගලන්තය-පකිස්ථානය තරඟය තිබී ඇත්තේ නොවැම්බර් 13 වන දිනයය. ඒ අනුව, ඔහුට කිසිඳු තරඟයකට සහභාගි වීමට හැකියාවක් නොතිබූ බවට පැහැදිලිය.

මේ අනුව සලකා බලන කලද

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපතිවරයා විසින් මෙම මණ්ඩලයට සපයන ලද ඉහත කී “y” ඇමුනුම බැල්මටම අසත්‍ය වාර්තාවක් වන බවටත්, **ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන් විසින්, ආයතනයේ අරමුදල් අවභාවිතා කර ඇති අන්දම වසන් කිරීම පිණිස සකසන ලද ලේඛණයක් පමණක් වන බවටත්** සලකා බැලිය යුතුව ඇත.
- තවද, භාණ්ඩාගාරික, ලසන්ත වික්‍රමසිංහ මහතා විසින්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලැබෙන මුදල් වැය කළ යුතු ආකාරය සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් පවතින බවටත්, වාර්ෂික ඇස්තමේන්තුවක් සකසා එම අයවැය ලේඛනයට අනුව වියදම් කරන බවත්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටු නිලධාරීන්ට විදේශ සංචාර සඳහා වියදම් කළ යුතු ප්‍රමාණය සහ ජාත්‍යන්තර ක්‍රිකට් සඳහා වියදම් කළ යුතු ප්‍රමාණය දක්වා ඇති බවටත්, 2022 වර්ෂය සඳහා එලෙස **අයවැය ලේඛනයක්** තිබෙන බවටත්, එය 2022.12.13 වන දින මෙම කමිටුවට ලබා දිය හැකි බවටත් දන්වා සිටිය මුත්, **එම ලේඛනය**

**ප්‍රමාද වී හෝ සැපයීමට ඔහු අපොහොසත් වී ඇත.** එපමණක්ද නොව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ගිණුම් වාර්තා සළකා බැලීම සඳහා ප්‍රධාන මූල්‍ය නිලධාරි වූ මහේෂ් බෝපගමගේ මහතාව සාක්ෂිකරුවෙක් වශයෙන් කැඳවීමට තීරණය කරමින් නොතීසියක් නිකුත් කළ ද, ඔහු ද පෙනී සිටීම මඟ හැර ඇත.

- එසේම, ගුවන් ගමන් බලපත්‍ර ලබා ගත්තේ ලියාපදිංචි ටිකට්පත් අලෙවි ආයතනවලින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් බවටද, එම ලේඛන ඉදිරිපත් කළ හැකි බවටද පවසා සිටියත්, **එම ලේඛනයන් ද ප්‍රමාද වී හෝ සැපයීමට අපොහොසත් වී ඇත.**
- **තවද,** ගුවන් ගමන් බලපත්‍ර ලබා ගත්තේ ලියාපදිංචි ටිකට්පත් අලෙවි ආයතනවලින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් බවටද, එම ලේඛන ඉදිරිපත් කළ හැකි බවටද, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිළධාරීන් බොහෝ දෙනෙක් ව්‍යාපාරික පංතියේ ගමන්ගත් බවට ද සභාපතිවරයා පැවසුවත්, ඉහත කී **"y"** ඇමුනුමට අනුව එක් එක් ගුවන් ගමන් ප්‍රවේශපත්‍ර සඳහා විවිධ වියදම් දක්වා ඇති හෙයින් එසේ විවිධ මිල ගණන් වලට ප්‍රවේශපත්‍ර මිලදී ගෙන තිබීම ප්‍රශ්න සහගතය.
- තවද, වර්තමානයේ ගමන් වියදම් අඩු කිරීම සඳහා පවතින වැඩ පිළිවෙලවල් අතර, සේවකයින් සේවය නිමා වී ආයතනයෙන් සපයා ඇති විශේෂ බස්රථවලින් ගමන් කළ යුතු බවට දක්වා සිටියද, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ කමිටු නිලධාරීන්ගේ ගමන් වියදම් පාලනය කිරීම සඳහා නිශ්චිත වැඩ පිළිවෙලක් සකසා නැත.

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපතිවරයා විසින් , ලෝක කුසලාන තරඟාවලියට සහභාගි වීමේ දී නිලධාරීන්ට අවශ්‍ය ආහාරපාන, නවාතැන්, අභ්‍යන්තර ගුවන් ගමන්, අභ්‍යන්තර ගමන් යනාදිය සඳහා වියදම් දැරිය යුත්තේ ආයතනය විසින් දිනකට ලබා දෙන ඇමෙරිකානු ඩොලර් 700 දීමනාවෙන් බවත්, ඒ අතරතුර , අනෙක් ක්‍රිකට් ක්‍රීඩාවට සම්බන්ධ විදේශිකයන්ට සංග්‍රහ කිරීම ඇතුළු වියදම් දැරීමට එම ඩොලර් 700 ගෙවන බවත්, රජයේ සේවකයන්ට ඩොලර් 530ක් ලැබෙන බවත්, පවසමින් ඊට අදාළ මුදල් ආමත්‍යාංශයේ 2015.05.15 වන දිනැති චක්‍ර ලේඛය ඇමුණුම් අංක: 23 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත.
- එසේ වුවද, එකී ඩොලර් 530ක් ලැබෙන්නේ රජයේ ඉහල තනතුරු දරන නිලධාරීන්ට වන අතර එය උපරිම මුදල වෙයි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන් මෙම මුදලටත් වඩා මුදලක් ලබා ගෙන ඇත.
- එපමණක්ද නොව, ජයන්ත ධර්මදාස, රවීන් වික්‍රමරත්න, සුජීව ගොඩලියද්ද, ක්‍රිෂාන්ත කපුවත්ත, ජනක පතිරණ, තිලක් වතුහේවා, සමන්ත දොඩම්වල, ප්‍රියන්ත අල්ගම, බන්දුල දිසානායක, රියර් අද්මිරාල් නිශාන්ත ද සිල්වා, නලීන් අපොන්සු යන අයවළුන්ට මෙම කමිටුව ඉදිරියෙහි ප්‍රකාශයක් ලබා දීම සඳහා පෙනී සිටින ලෙසට යවන ලද නොතීසිය ද නොසලකා හැරීම නිසා තරඟාවලියට / ක්‍රිකට් ක්‍රීඩාවට තිබූ ඔවුන්ගේ දායකත්වය සොයා බැලීමට නොහැකි විය.

- **ක්‍රීඩකයින්ගේ විනයට අදාළ වූ කරුණු**

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාවත් ,ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයත් ක්‍රීඩකයින් අතරත් පවතින ගිවිසුමත් මගින් ක්‍රීඩා තරඟයකට සහභාගි වී සිටින ක්‍රීඩකයන්ගේ ගමන් බිමන්, මත්පැන් පානය සහ කැසිනෝ සෙල්ලම් කිරීම, යනාදිය පාලනය කිරීමක් වන මුත් , ක්‍රීඩකයින් එකී ව්‍යවස්ථාවේ සහ ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කර ඇති බවට ඉදිරිපත් වූ සාක්ෂි මගින් මෙන්ම, ක්‍රීඩා කළමනාකරු විසින් ක්‍රිකට් ආයතනයට ලබා දුන් සහ මෙම මණ්ඩලයට ඉදිරිපත් කල ඇමුණුම ‘9’ වාර්තාව අනුව පැහැදිලි වෙයි. එහිදී ධනිෂ්ක ගුණතිලක සහ චාමික කරුණාරත්න සම්බන්ධව සඳහන් කළ ඉහත සිද්ධීන් වලට අමතරව, 2022.10.15 වන වනිඳු හසරංග, කුසල් මෙන්ඩිස්, ජෙෆ්රි වැන්ඩසෙ, අෂේන් බණ්ඩාර යන ක්‍රීඩකයන් හෝටලයට පැමිණිය යුතු නියමිත කාල සීමාව වූ රාත්‍රී 11.45 වේලාව කඩ කරමින් පසු දින උදෑසන 12.35ට පැමිණ ඇත. ඒ අනුව ඔවුන්ට ඕස්ට්‍රේලියානු ඩොලර් 25 බැගින් දඩයක් සමග තදින් අවවාද කිරීමත් සිදු ඇත.

- **තවද,ජාතික ක්‍රිකට් කණ්ඩායමේ කළමනාකරු වශයෙන් කටයුතු කරන මහින්ද බන්දුල හලංගොඩ** මහතාට අනුව, ක්‍රීඩකයින් සිටි හෝටලයේ 6 වන සහ 7 වන මහල්වල සිගරට් කොට තිබී ඇත.

- රාත්‍රි කාලයේ දී සහ විවේක කාලවල දී ක්‍රීඩකයින් අනවශ්‍ය ගමන්බිමන් යාම තුළින් විවිධ ප්‍රශ්නවලට මුහුණ දෙන බවටත් , තමා විසින් ම විනය පාලනයක් ඇති කර ගැනීම අවශ්‍ය බවත්, ක්‍රීඩකයින්ගේ විනය පැවතිය යුතු අන්දම ආචාර ධර්ම පද්ධතියේ මෙන්ම ගිවිසුමේ ද සඳහන් වන හෙයින් , ස්වයං විනය පාලනයක් පවත්වා ගැනීම වැදගත් වන බවත් ක්‍රීඩකයින් පිළි ගෙන ඇත.

- ක්‍රිකට් ක්‍රීඩකයින් විසින් සමාජ මාධ්‍ය අනිසි අන්දමට හැසිරවීම තුළින් හානි සිදුවන බැවින් සමාජ මාධ්‍ය භාවිතය පාලනය කල යුතු බවත්, ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ විනය පාලනයක් තිබිය යුතු බවත්, ක්‍රීඩකයන්ගේ පෞද්ගලික කළමනාකරුවන්ට ප්‍රමිතියක් තිබිය යුතු බවත්, ක්‍රීඩකයින්ගේ පෞද්ගලික කළමනාකරුවන් අධීක්ෂණය කිරීමේ ආයතනයක් තිබිය යුතු බවත්, ඒ අයට ආචාර ධර්ම පද්ධතියක් තිබිය යුතු බවත් , සමාජ මාධ්‍ය වගකීමෙන් තොරව කටයුතු කරන බවත්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ තේරීම් කමිටුවේ සභාපති වූ **ගාල්ලගේ ප්‍රමෝද්‍ය වික්‍රමසිංහ** පෙන්වා දී ඇත.

- **ක්‍රීඩකයින්ගේ ශාරීරික යෝග්‍යතාවය**

❖ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ තේරීම් කමිටුවේ සභාපති වූ **ගාල්ලගේ ප්‍රමෝද්‍ය වික්‍රමසිංහ** මහතාගේ ප්‍රකාශයට අනුව, තරඟාවලියෙන් තරඟාවලියට, ක්‍රීඩකයින් තරඟයට සුදුසු ශාරීරික යෝග්‍යතාවයෙන් සිටී ද යන්න  තේරීම් කමිටුව විසින් සොයා බලයි. එහිදී සෑම ක්‍රීඩකයෙක් සම්බන්ධව වන භෞත චිකිත්සකගේ වාර්තාව ද සලකා බලයි. ජාතික කණ්ඩායමට ක්‍රීඩා කළ හැකි ක්‍රීඩකයෙකුට සුදුසුකම් ලැබීම සඳහා ප්‍රථමයෙන්  කි.මී. 2ක් විනාඩි 8යි, තත්. 35ක් ඇතුළත දිවීම සහ ශරීරයේ ඇති මේද ප්‍රමාණය ,මි.මී. 80කට අඩු විය යුතුව තිබුනද, පසුව  ඊට විවිධ  විරෝධතා මතුවූ හෙයින්, ක්‍රිකට් උපදේශක කමිටුව විසින් තවත් සහන ලබා දෙමින්,  කි.මී.2. විනාඩි 8යි, තත්. 55 දක්වාත්, මේදය මැනීම 80 සිට 85 දක්වාත් වෙනස් කර ඇත. එංගලන්ත කණ්ඩායම, නවසීලන්ත, ඕස්ට්‍රේලියානු කණ්ඩායම විනාඩි 7, තත්.30 මට්ටමටත්,  මේදය 65 මට්ටමටත් පවති. එබැවින් ක්‍රිකට් ක්‍රීඩාව ජාත්‍යන්තර තලයේ දි ජයග්‍රහණයන් කරා ගෙන යාම සඳහා අපේ  රටේ  ක්‍රීඩකයන්ගේ ශාරිරික යෝග්‍යතාවය ඉහළ මට්ටමක තිබිය යුතු බවට නිරීක්ෂණය වෙයි.

❖ දැනට, ඉහළ කාර්ය සාධන මධ්‍යස්ථානය මගින් (High performance Center)  ක්‍රීඩකයන්ගේ ශාරිරික යෝග්‍යතා පරීක්ෂණ හතරක් අවුරුද්දකට  සිදු කරයි.  එම පරීක්ෂණවල දී ක්‍රීඩකයින්ට ඉහත සඳහන් නිර්නායක නොමැති නම්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයත් සමඟ

ඔවුන්ට පවතින ගිවිසුමට අනුව ලැබිය යුතු මුදලින් පිළිවෙලින් 20%, 40%, 60%, 80% වශයෙන් අඩු කිරීමක් සිදු කරයි. 80% දී , හතර ම අසමත් වෙච්ච කෙනෙකු සිටියහොත් ඔහුව තෝරා නොගනී.

❖ එසේම, ඕස්ට්‍රේලියාවේ පැවැති ටී. 20 ලෝක කුසලාන තරඟාවලිය සඳහා සහභාගිවූ දුෂ්මන්ත චමීර සහ බිනුර ප්‍රනාන්දු යන ක්‍රීඩකයින් දෙදෙනාට වූයේ අවුරුදු දෙකක කාලයක් තිස්සේ බරපතල ආබාධ තිබුන බවටද, (එක්කෙනෙකුට වළලුකරෙහි ආබාධයක් සහ අනෙක් කෙනාට කකුලෙහි මස් පිඩු වේදනා) තිබු බවත්, එසේ තිබියදී ඒ අයගේ ශාරීරික යෝග්‍යතා කළමනාකරණය කරමින් ටී.20 ලෝක කුසලාන තරඟාවලියට සහභාගි කර තිබූ බවටද අණාවරණය වෙයි.

❖ පසුව, දුෂ්මන්ත චමීර සංචිතයෙන් ඉවත් කර,පෙර සිටම ඕස්ට්‍රේලියාවේ දී සැලසුම් කර තිබු ශල්‍ය ශල්‍ය කර්මයට සහභාගි වීමට අවස්ථාව සලසා දී ඇත.

❖ **ජාතික ක්‍රිකට් කණ්ඩායමේ කළමනාකරු වශයෙන් කටයුතු කරන මහින්ද බන්දුල හලංගොඩ** මහතාට අනුව, ඕස්ට්‍රේලියාවේ දී දුෂ්මන්ත චමීර ආබාධයට ලක් වුනේ බත් කෙණ්ඩේ වුවද, වළලු කරේ තිබූ ආබාධය ද තිබී එම පාදයෙහි මය. වළලු කරෙහි තිබෙන ආබාධය නිසා මෙම ආබාධය සිදු වන්නට ඇතැයි 'බ්‍රෙට් හැරොජ්' පවසා ඇත. පසුව, දුෂ්මන්ත චමීර සංචිතයෙන් ඉවත් කර, පෙර සිටම ඕස්ට්‍රේලියාවේ දී සැලසුම් කර තිබු ශල්‍ය ශල්‍ය කර්මයට සහභාගි වීමට අවස්ථාව සලසා දී ඇත. අවධානමක් සහිතව දුෂ්මන්ත චමීරව තෝරා ගෙන ඇත්තේ, ඔහු ලංකාවේ සිටින දක්ෂතම වේග පන්දු යවන්නා වූ හෙයිනි.

- **ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා වෛද්‍ය ඒකකයේ වෛද්‍යවරයෙක් ලෙස සේවය කරනු ලබන වෛද්‍ය කිරිඇල්ල ආරච්චිගේ ප්‍රදීප් කිරිඇල්ල** මහතා ලබා දුන් සාක්ෂි වලට අනුව, ක්‍රීඩකයින් තමන්ට ක්‍රීඩා කිරීමට ස්ථානයක් ලබා ගැනීමට උත්සාහ දරන මුත්,  සියළු තරඟයන් දිනා ගැනීම මූලික පරමාර්ථය  විය යුතුව ඇති බැවින්, ක්‍රීඩකයින් තේරීම් කිරීමේ දී ක්‍රීඩකයාගේ කැමැත්ත පරිදි නොව, ක්‍රීඩා කිරීමට සුදුසු ක්‍රීඩකයා කවුදැයි තෝරා ගෙන යැවීම සිදු කළ යුතුව ඇත.
- **ජාතික ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයෙක් වූ මැස්ටියගේ දොන් ධනිෂ්ක ගුණතිලකට අනුව,** සංචාරය සඳහා ක්‍රීඩකයින්ව තේරීම් කරන අවස්ථාවේදි, ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වුවහොත් හා යැමට පෙර ආබාධයන් නොමැති නම්, කණ්ඩායමේ ඉන්න වෛද්‍යවරයාගේ වාර්තාව බලා කණ්ඩායමට තෝරා ගනි.
- එසේම, ඕස්ට්‍රේලියාවේ පැවැති ටී. 20 ලෝක කුසලාන තරඟාවලිය සඳහා සහභාගිවූ දුෂ්මන්ත චමීර සහ බිනුර ප්‍රනාන්දු යන ක්‍රීඩකයින් දෙදෙනාට වූයේ අවුරුදු දෙකක කාලයක් තිස්සේ බරපතල ආබාධ තිබුන බවටද,  (එක්කෙනෙකුට වළලුකරෙහි ආබාධයක් සහ අනෙක් කෙනාට කකුලෙහි මස් පිඩු වේදනා)  තිබු බවත්,  එසේ තිබියදී , ඒ අයගේ ශාරීරික යෝග්‍යතා කළමනාකරණය කරමින් ටී.20 ලෝක කුසලාන තරඟාවලියට සහභාගි කර තිබූ බවටද අණාවරණය වෙයි.
- **ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ  සභාපති 'ශම්මි ශිරාජ් සිල්වා' මහතා ට අනුව,** දෙවන පෙළ ශ්‍රී ලංකා ක්‍රිකට් "A " කණ්ඩායම වන බවත්,  අපට පසු පෙළ කණ්ඩායමක් නොමැතිව කාලයක් තිබුණ මුත් දැනට

කණ්ඩායම් 4ක් පමණ සිටින බවට පැවසුවද, වමත් පන්දු යවන දෙවන පෙළ ක්‍රීඩකයෙක් ජාතික ක්‍රිකට් සංචිතයේ හිටියා නම්, බිනුර ප්‍රනාන්දුගෙන් පසුව ඒ වෙනුවට යවන්න තිබුනු බවත් එනමුදු සුදුසු ක්‍රීඩකයෙකු නොසිටි බවටත් පිලිගෙන ඇත. බිනුර ප්‍රනාන්දුගේ ශරීර ව්‍යුහය අනුව ඔහු නිරන්තරයෙන් මස් පිඩු පෙරලීම්වලට ලක් වෙන ක්‍රීඩකයෙක්ව බවට දැන දැන ඔහුව පුනරුත්ථාපනය කරමින් තරඟ වලට සහභාගි කර ගෙන ඇත.

❖ එසේම, ශාරීරික ආබාධයන්ට ලක් වූ ඇතැම් අය ටී. 20 ලෝක කුසලාන ක්‍රිකට් ක්‍රීඩා තරඟාවලිවලට සහභාගි කර ගැනීමට හේතුව වන්නේ ආදේශකයන් නොමැති වීම නිසාය.

❖ වර්තමානයේ ක්‍රිකට් ක්‍රීඩා සමාජ 26 ක් ඇති මුත්, ක්‍රීඩකයන්ගේ ගුණාත්මක භාවය බෙදී යන හෙයින්, උසස් මට්ටමේ ප්‍රමිතියක් තිබෙන ක්‍රීඩකයන් බිහි නොවන බවත්, ක්‍රීඩකයන්ගේ දක්ෂතා මට්ටම ජාත්‍යන්තර තලය සමග සැසඳීමේ දී අඩු මට්ටමක පවතින බවත්, ක්‍රීඩකයින් විශාල සංඛ්‍යාවකට ටියර් A කණ්ඩායමට ක්‍රීඩා කිරීමට අවස්ථාව ලැබීම වාසියක් වුවද, ජාතික කණ්ඩායමට ක්‍රීඩා කිරීමට බොහොමයක් ක්‍රීඩකයින්ට දක්ෂතා දැක්වීමට අවස්ථාව නොලැබෙන බැවින් උසස් මට්ටමේ දෙවන පෙළ ක්‍රිකට් ක්‍රීඩා කණ්ඩායමක් වර්තමානයේ දක්නට නොමැති බවටත්, බොහොමයක් ක්‍රීඩකයින් රට අත හැර ගොස් ඇති බවටත්, පළමු පෙළ ක්‍රීඩා සමාජ 8ක් 10 ක් පමණ ප්‍රමාණවත් වන බවටත් අනාවරණය වෙයි.

❖ තවද, ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ තෝරා ගැනීම්වලට සම්බන්ධ නොවන බවට ලිඛිතව කරන ලද දැනුම් දීමකට අනුව ඕස්ට්‍රේලියාවේ පැවැති ටී. 20 ලෝක කුසලාන තරඟාවලිය සඳහා ක්‍රිකට් ක්‍රීඩක සංචිතය තෝරා ගැනීමේදි ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව සහභාගිත්වය නොතිබුණ බවටත්, ඒ මත දැඩි බලපෑමක් වන බවටත් කරුණු අනාවරණය විය.

.

➢ **මානසික පීඩා**

❖ **ක්‍රීඩක එදිරිමුනි චාමික දිනුෂාන් පෙරේරා කරුණාරත්න** ලබා දුන් සාක්ෂියට අනුව, ටී.20 ලෝක කුසලාන තරඟාවලිය අතරතුර දී සමාජ මාධ්‍යවලින් නොයෙක් ආකාරයේ අපහාසාත්මක ප්‍රවෘත්ති පළ කිරීමේ හේතුවෙන් ඔහුට විශාල මානසික පීඩනයකට ඔහුව ලක් වී ඇති අතර, එය දක්ෂතා නොපෙන්වීමට එක් හේතුවක් වී ඇත. තවද, ඉහත කී ක්‍රීඩකයා ටී.20 ලෝක කුසලාන තරඟාවලිය අතරතුර දී තවත් ක්‍රීඩකයින් හය දෙනෙක් සමඟ කැසිනෝ ශාලාවක් තුල සිටියදී, එතැනට පැමිණි වෙනත් පුද්ගලයෙක් ගත් ඡායාරූපයක්, සමාජ මාධ්‍යයට යෑම තුලින් ක්‍රීඩකයන්ට සහ ලංකාවට ප්‍රශ්නයක් විය හැකි යැයි සිතූ නිසා, එම පුද්ගලයා සමඟින් බහින්බස්වීමක් සිදු කළ බවට ක්‍රීඩකයා පිළි ගෙන ඇත.

## ➢ නිර්දේශයන්

❖ **ධනිෂ්ක ගුණතිලක විසින් ඕස්ට්‍රේලියාවේ පදිංචි කාන්තාවකට ලිංගික අතවර සිදුකිරීම.**

මෙම සිද්ධිය සිදු වූයේ කාන්තාවගේ කැමැත්තෙන් වන බවට ක්‍රීඩකයා පැවසුවත්,

❖ එම සිදුවීමට ඔහු සම්බන්ධ වූයේ ජාත්‍යන්තර තරඟාවලියක් අතරතුරදී ශ්‍රී ලංකාව නියෝජනය කරන ක්‍රීඩකයෙකු වශයෙනි. මෙම සංචාරය ඔහුගේ සුඛ විහරණය සඳහා, තම වියදමින් කළ සංචාරයක් නොවේ. ක්‍රීඩාව පමණක් නොව, තම රට වෙනුවෙන්ද දැඩි කැපවීමේ වගකීමක් ඔහුට තිබිණ.

❖ මෙමගින් අපකීර්තියට පත් වුනේ ඔහු පමණක් නොව, ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ඇතුළු නිළධාරි කණ්ඩායමත්, මුළු මහත් අප දේශයත්ය.

❖ **ජාතික ක්‍රිකට් කණ්ඩායමේ කළමනාකරු වශයෙන් කටයුතු කරන මහින්ද බන්දුල හලංගොඩ** මහතාගේ ප්‍රකාශය මගින් , ක්‍රීඩකයින්ට රාත්‍රී 11.45 නවාතැනට පැමිණිය යුතුව තිබුනද, 2022.11.02 වන දින බ්‍රිස්බේන්හි තිබූ තරඟය නිමවා ආපසු හෝටලයට පැමිණීම ප්‍රමාද වූ හෙයින් නවාතැනට පැමිණීමේ කාලය රාත්‍රී 1.00 දක්වා

දීර්ඝ කර ඇත. මේ කාලය අයුතු ලෙස ප්‍රයෝජන ගත් **ධනිෂ්ක ගුණතිලක** තනිවම ගොස් මෙම සිද්ධියට සම්බන්ධ වී ඇත.

**මේ අනුව මෙම ක්‍රීඩකයාට විනය විරෝධී ක්‍රියාවන් සඳහා දෙනු ලබන දඬුවම, සියළුම ක්‍රීඩකයින්ට විනය ගරුක වීමේ සහ ස්වයං පාලනයේ වැදගත්කම ලබා දෙන දඬුවමක් විය යුතු බවට නිර්දේශ කරමු.**

- **චාමික කරුණාරත්න විසින් ඕස්ට්‍රේලියාවේ නවාතැන් ගත් හෝටල් කාමරය තුල පහනක් දැල්වීම සහ පුද්ගලයෙකු සමඟ ආරවුල් ඇතිකර ගැනීම**

  - ඉහත සිද්ධීන් වලට අදාළව දැනටමත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ද පරීක්ෂණයක් සිදු කොට **දඬුවම් නියම කර ඇති බැවින් තවදුරටත් ඔහුට දඬුවම් ලබා නොදිය යුතු බවට නිර්දේශ කරමු.**

- **බොර්න් අගේන්' ආගම හේතුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට වන අනිසි බලපෑම්**

❖ ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයින් සහ නිලධාරින් අතර 'බෝර්න් අගේන්' ආගම වැළඳ ගත් අය සිටින බවත්,

❖ **'බෝර්න් අගේන්' ආගමික නායක** ෆොෆර්ට් ජෙරොම් විසින් සිය අනුගාමිකයින් වැඩි කර ගැනීමට විවිධාකාරයේ උපක්‍රමයන් යොදන බවටත් සහ ක්‍රිකට් ක්‍රීඩාවට සම්බන්ධ **'**බෝර්න් අගේන්' අනුගාමිකයින් සංඛ්‍යාව සම්බන්ධව **සත්‍ය කරුණු වසන් කරමින්** සාක්ෂි ලබා දෙන බවටත්,

❖ 'බෝර්න් අගේන්' ආගමේ පාස්ටර් ටෙරී විසින් බෞද්ධයෙකුවූ **'චාමික කරුණාරත්න' ක්‍රීඩකයාව** මුණ ගැසී 'බෝර්න් අගේන්' ආගමේ වැදගත්කම පවසා තිබූ බවටත්,

❖ **ප්‍රමෝද් භානුක බණ්ඩාර රාජපක්ෂ නැමැති ක්‍රීඩකයා** උපතින් බුද්ධාගම වැළඳ ගෙන සිටියද, 2015 අවසාන භාගයේ සිට 'බෝර්න් එගේන්' ආගමේ අනුගාමිකයෙක් බවට පරිවර්තනය වී ඇති බවටත්,

**අනාවරණය වන හෙයින්ද,**

❖ ෆොෆර්ට් ජෙරොම් විසින් දෙවියන් වහන්සේ විසින් යමෙකුට උදව්වක් කරන ලෙසට පණිවුඩයක් නොදුන්නහොත් ඒ පුද්ගලයාට උදව්වක් කිරීමට හැකියාවක් නොමැති බවටත්, එබඳු අවස්ථාවක යමෙකුට පිහිට වන්නේ ඔහු වටා සිටින පිරිසගෙන් උදව් ලබා ගනිමින් යැයි පැහැදිලිවම පවසා ඇති හෙයින්, 'බෝර්න් අගේන්'ආගමේ සාමාජිකයෙකු හෝ

අනුගාමිකයෙකු වීම / ඇදහීම තුලින්, යම් තැනැත්තෙකුට නියත වශයෙන්ම කායික සහ/හෝ මානසික සුවය අත්පත්කර ගත නොහැකි බවට නිරීක්ෂණය වන හෙයින්ද,

- ❖ ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයින්, ශ්‍රී ලංකාවට අභිමානයක් රැගෙන එන ජාතික සම්පතක් වන හෙයින්ද,
- ❖ ශ්‍රී ලංකාවට ජයක් අත්පත් කරදීම සඳහා ක්‍රිකට් ක්‍රීඩකයින් බුදුරජාණන් වහන්සේගෙන් සහ විවිධ දෙවියන් වහන්සේලාගෙන් පිහිට පතන බවට පෙනී යන හෙයින්ද,

**1.ජාත්‍යන්තර තරගාවලියකට ක්‍රීඩකයින් පිටත්විමට පෙර මීට වසර ගණනාවක් අනුගමනය කල ආගමික වතාවත් නැවතත් ඇති කරමින්, අප රටේ සුදුසු බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් සහ/හෝ ආගමික පූජක තුමන්ලා සහභාගි කරවාගෙන, ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමට ආශිර්වාද කිරිමේ ක්‍රියාවලියක් ආරම්භ කිරිම සුදුසු බවට නිර්දේශ කරමු. මෙගින්, අනවශ්‍ය ඇදහිලි සහ මිත්‍යා විශ්වාස ක්‍රිකට් ක්‍රිඩකයින් අතරට හෝ ක්‍රිකට් ආයතනයට හෝ ඒම වලක්වා ගැනීමට පමණක් නොව, ක්‍රිකට් ක්‍රිඩකයින්ට සුදුසු ආශිර්වාදයක් ලබා ගැනීමටද හැකියාවක් පවති.**

- ❖ තවද, ඉදිරිපත් වූ කරුණු සලකා බැලීමේදි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සහ ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායම තුල සිටින බෝර්න් අගේන්’ සාමාජිකයින් සහ/හෝ අනුගාමිකයින් සම්බන්ධව සාක්ෂිකරුවන් සත්‍ය සාක්ෂියක් ලබාදීම සහ/හෝ නිවැරිදි කරුණු ඉදිරිපත් කිරීම සිදු නොකළ හෙයින්ද, විශේෂයෙන්ම ඇතැම් ක්‍රීඩකයින් තම අනාගතයට යම් බලපෑමක් වෙතැයි යන බිය මත, මීට අදාලව සාක්ෂි දීමෙන් වැළකී සිටින

බවට නිරීක්ෂණය කල හෙයින් ද, **'බොර්න් අගේන්' ආගම හේතුවෙන්, ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට යම් බලපෑමක් සිදු වී ඇත්ද, යන්න නිශ්චිතවම නිගමණය කල නොහැක.**

**2. කෙසේ වුවද, 'බොර්න් අගේන්' ආගම හේතුවෙන්, ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට ඉදිරියේදි බලපෑම් සිදු වීමට ඉඩ ඇති බවට නිරීක්ෂණය වන හෙයින්, ඒ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කිරීම ඉතා වැදගත් බවට නිර්දේශ කරමු.**

## ➢ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අරමුදල් අවභාවිතය

- ❖ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වියදමින්, 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරඟාවලිය සඳහා ඕස්ට්‍රේලියාවේ සංචාරය කරන එම ආයතනයේ නිලධාරීන් **දහසය දෙනාගේ** වියදම් අවම මට්ටමකින් පවත්වන ලෙසට, ක්‍රීඩා හා යෞවන අමාත්‍යාංශ ලේකම්වරයා විසින්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලේකම්වරයාට දැනුම් දී තිබූ අවස්ථාවකදී , ගුවන් ගමන් ටිකට් පත්‍ර මිලදී ගැනීම සඳහා රුපියල් 25,687,498/-ක් ද (ජෙරොම් ජයරත්න මහතාගේ වියදම හැර) අනිකුත් වියදම් සඳහා **ඇමෙරිකානු ඩොලර්** 1,07,800 ක් ද, වැය කර තිබූ බවට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති විසින් මෙම මණ්ඩලයට ලබා දුන් “y” ඇමුනුමට අනුව කරුණු අනාවරණය වී ඇති හෙයින්ද,
- ❖ එමෙන්ම, ඉහත කී “y” ඇමුනුම බැලුබැල්මටම අසත්‍ය වාර්තාවක් වන බවටත්, (හේතු සඳහා නිරීක්ෂණ බලන්න) **ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන් විසින්, ආයතනයේ අරමුදල් අවභාවිතා කර ඇති අන්දම මෙම මණ්ඩලයට වසන් කිරීම පිණිස සකසන ලද ලේඛණයක් පමණක් වන බවටත් පෙනෙන හෙයින්ද,**
- ❖ ජෙරොම් ජයරත්න ගියේ ඕස්ට්‍රේලියාවේ උසස් කාර්ය සාධන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීම සහ තරඟ නැරඹීම සඳහා යැයි ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති ශම්මි සිල්වා පවසා තිබුනද, ජෙරොම් ජයරත්න මහතා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ එම

තනතුරු නොදැරූ බවට පමණක් නොව, ඔහු කිසිඳු හෝ කාර්යකට සම්බන්ධ නොවී ඔහුගේ සොහොයුරියගේ නිවසේ රැඳී සිට ඇති බවටත්, තවත් නිලධාරින් කිහිප දෙනෙකු යම් යම් තරඟ නැරඹූවා යැයි පැවසුවද, එසේ පවසා ඇති දිනවල එම තරඟ නැරඹීමේ හැකියාවක් තිබී නැති හෙයින්ද (නිරීක්ෂණ බලන්න),

- ❖ භාණ්ඩාගාරික, ලසන්ත වික්‍රමසිංහ මහතා විසින්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලැබෙන මුදල් වැය කළ යුතු ආකාරය සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් පවතින බවටත්, වාර්ෂික ඇස්තමේන්තුවක් සකසා එම අයවැය ලේඛනයට අනුව වියදම් කරන බවත්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටු නිලධාරීන්ට විදේශ සංචාර සඳහා වියදම් කළ යුතු ප්‍රමාණය සහ ජාත්‍යන්තර ක්‍රිකට් සඳහා වියදම් කළ යුතු ප්‍රමාණය දක්වා ඇති බවටත්, 2022 වර්ෂය සඳහා එලෙස **අයවැය ලේඛනයක්** තිබෙන බවටත්, එය 2022.12.13 වන දින මෙම කමිටුවට ලබා දිය හැකි බවටත් දන්වා සිටිය මුත්, **එම ලේඛනය ප්‍රමාද වී හෝ සැපයීමට ඔහු අපොහොසත් වී ඇති හෙයින්ද,**

- ❖ ගුවන් ගමන් බලපත්‍ර ලබා ගත්තේ ලියාපදිංචි ටිකට්පත් අලෙවි ආයතනවලින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් බවටද, එම ලේඛන ඉදිරිපත් කළ හැකි බවටද, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිළධාරීන් බොහෝ දෙනෙක් ව්‍යාපාරික පංතියේ ගමන්ගත් බවට ද සභාපතිවරයා පැවසුවත්, ඉහත කී "y" ඇමුනුමට අනුව එක් එක් ගුවන් ගමන් ප්‍රවේශපත්‍ර සඳහා විවිධ වියදම් දක්වා ඇති හෙයින් එසේ විවිධ මිල ගණන් වලට ප්‍රවේශ පත්‍ර ගත්තේ මන්දැයි යන ප්‍රශ්නය මතුවන හෙයින්ද,

- ❖ ඕස්ට්‍රේලියාවේ දී පැවැති 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරඟාවලියට උපහාර පිදීම වෙනුවෙන් ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර දී 2022.10.11 වන දින ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සූදානම් කර තිබූ නිල උත්සවය සඳහා පිළියෙල කළ රාත්‍රී භෝජන සංග්‍රහයේදී, 'ශ්‍රී ලංකා ක්‍රිකට් නියෝජිත' වශයෙන් හැඳින්වූ 'මලික් ෂවීර්' යන අය විසින් ප්‍රවේශ පත්‍ර අලෙවි කිරීමක් සිදු කර තිබුන මුත්, ඉන් ලැබුණු ආදායම් සම්බන්ධයෙන් වූ ගිණුම් එකී 'මලික් ෂවීර්' විසින් මෙතෙක් ලබා දී නොමැති බවට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලේකම්, මොහාන් ද සිල්වා ලබා දුන් සාක්ෂි මගින් කරුණු අනාවරණය වන හෙයින්ද,
- ❖ පිති සහ සමරු වෙන්දේසි කොට ද මුදල් රැස් කර තිබූ බවට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන විධායක නිළධාරි ඈෂ්ලි ද සිල්වා ලබා දුන් සාක්ෂි මගින් අනාවරණය වන හෙයින්ද,
- ❖ ක්‍රීඩකයින්ගේ පුහුණු උපදේශකවරයෙකු වශයෙන් ක්‍රිකට් ආයතනයේ වියදමින් ඕස්ට්‍රේලියාවට ගොස් තිබූ මහේල ජයවර්ධන විසින් 'මිනිස්ට්‍රි ඔෆ් ක්‍රැබ්ස්' නම් අවන්හල විවෘත කර තිබූ බවටත් අනාවරණය වන හෙයින්ද,

**ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාවේ 2(a) රෙගුලාසියට අනුව, ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාව උසස් තත්වයට පත් කිරීම, ධෛර්යමත් කිරීම ප්‍රධාන අරමුණක් විය යුතු බැවින් ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාව උසස් තත්වයට පත් කිරීම සහ ධෛර්යමත් කිරීම යනාදිය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනට ලැබී ඇති අරමුදල්, භාවිතා කළ යුතුය. එසේ වුවද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වගකිවයුතු බොහෝ නිලධාරින්, 2022**

අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරගාවලිය පෙරටු කොට, **ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අරමුදල්, ක්‍රිකට් ක්‍රීඩාව උසස් තත්වයට පත් කිරීම, ධෛර්යමත් කිරීමට නොව, තමන් කරනු ලබන ගරු සේවයට දිය යුතු ත්‍යාගයක් ලෙසට සලකමින්, තම පුද්ගලික සුඛ විහරණය සඳහා** යොදා ගෙන ඇති බවට පෙනී යන හෙයින්ද,

- **1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වන සහ 41 වන වගන්තීන් ප්‍රකාර ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගයන්ට අනුව** 2016.10.27 වන දිනැති අංක: 1990/23 සහ අති ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති විධිවිධාන වලට අනුව ජාතික ක්‍රීඩා සංගමයක් ලෙස **ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය** ලියාපදිංචි කර ඇති බැවින් සහ එකී ගැසට් පත්‍රයෙහි 111වන කොටසෙහි දැක්වෙන අයුරින්, **ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය** විසින් තම කාර්යන්, බලතල සහ කර්තව්‍යයන් ඉටු කළ යුතුව ඇති මුත්, එම කාර්යන්, බලතල සහ කර්තව්‍යයන් ඉටු කිරීමේ අරමුණින් 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරගාවලිය සඳහා **ක්‍රිකට් ආයතනයේ වගකිවයුතු බොහෝ නිලධාරීන්** විදේශ ගතව තිබූ බවට පෙනී නොයන හෙයින්ද,

  I 2022 අයි.සී.සී. ටී.20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරගාවලියට අදාල **සංචාරයේ ආදායම් සහ වියදම් පිළිබඳ වහාම ස්වාධීන විගණනයක් සිදු කිරීමටත්,**

  **II එසේ විගණනය සිදුකිරීමට පෙර, අදාල ලේඛන වෙනස් කිරීමට හෝ සැඟවීම වලකාලීමට පියවර ගැනීමටත්,**

**III අනතුරුව, ඉදිරිපත් කරුණු සලකා බලමින් ආයතනයේ අරමුදල් අවභාවිතා කල සහ ඊට ආධාර උපකාර සියළු දෙනාටම එරෙහිව ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව මුදල් වංචා කිරීම, සාපරාධි විශ්වාසය කඩකිරීම, සාපරාධි සාවද්‍ය පරිහරණය කිරීම, අනර්ථය, යනාදී චෝදනා/ චෝදනාවන් ඉදිරිපත් කරමින් නීති මගින් කටයුතු කළ යුතු බවටත්,**

**IV 1973 අංක: 25 දරන ක්‍රීඩා පනතේ 32 (අ), (ආ) සහ (ඇ)වන වගන්තීන්වලට අනුව පහත දැක්වෙන අයුරින් ක්‍රියා කල හැකි බවටත්,**

32 (අ) සංගමයේ නිලධාරීන්ගේ හෝ සාමාජිකයන්ගේ දූෂණ, විෂමාචාරතා හෝ අක්‍රමිකතා යමක් සඳහා ප්‍රතිකර්ම යොදන ලෙස අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ලිඛිත නිවේදනයන් මගින් දැනුම් දෙනු ලැබූ විට ඒ නිවේදනයේ සඳහන්ව තිබිය හැකි කාලය තුළ දී එසේ ප්‍රතිකර්ම යෙදීමට අපොහොසත් වීම හෝ ප්‍රතිකර්ම යෙදීම නොසළකා හැරීම නිසා හෝ,

(ආ) අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා අකර්මන්‍යව සිටීම සහ සහයෝගය නොදීම හෝ අවහිර කිරීම නිසා හෝ

(ඇ) සංගමයේ යුතුකම් හා කාර්යයන් ඉටු කිරීම පැහැර හැරීම නිසා

ජාතික ක්‍රීඩා සංගමයක් ලියාපදිංචි කිරීම ප්‍රතිශක්ති කිරීම හෝ එහි ලියාපදිංචිය අත් හිටුවීම හෝ අවලංගු කිරීම අමාත්‍යවරයාට සිදු කළ හැකි බවටද,

**නිර්දේශ කරමු.**

**V.** තවද, **ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතු** මුදල් ඉදිරියට පරිහරණය කිරීමේදි, විශ්වසනීයත්වය සහ විනිවිදභාවය තහවුරු කිරීම පිණිසත්, අවභාවිතා කිරීම/දූෂණ වලකා ලීම පිණිසත්, වෙනත් ආයතනයන් සමඟින් ක්‍රිකට් ආයතනය ගිවිසුම් වලට එළඹීමේදි ද, විකිණීම් සහ මිලදී ගැනීම් වලදීද, ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ, **රජයේ** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කල යුතු බවටද,

**නිර්දේශ කරමු.**

- **ක්‍රීඩකයින්ගේ විනයට අදාලවූ කරුණු :**

❖ ක්‍රීඩකයෙකුට යෝග්‍යතාවය මෙන් ම කැපවීම ද 100%ක් අවශ්‍ය සාධකයකි. ඔවුන් ශ්‍රී ලංකාව නියෝජනය කරන හෙයින්, ක්‍රීඩාවෙන් පසුව මදක් විනෝද වීම සුදුසු වුවද, එමගින් ඔවුන්ගේ වගකීම් සහ යුතුකම් මොහොතකටවත් අමතක නොකල යුතුය. එබැවින්, ප්‍රශ්න ඇති නොවන අන්දමට කැප වී කටයුතු කල යුතුය. ක්‍රීඩකයින්ගේ විනය පැවතිය යුතු අන්දම ආචාරධර්ම පද්ධතියේ මෙන්ම ගිවිසුමේ ද සඳහන් වෙයි.

**එසේ වුවද,**

❖ ක්‍රීඩකයින් රාත්‍රි කාලයේ දී සහ විවේක කාලවල දී අනවශ්‍ය ගමන්බිමන් යාම, සමාජ මාධ්‍ය අනිසි අන්දමට හැසිරවීම යනාදිය තුළින් විවිධ ප්‍රශ්නවලට එක් පුද්ගලයෙකු පමණක් නොව, මුළු කණ්ඩායමම මුහුණ දෙන බවටත්,

❖ ස්වයං විනය පාලනයක් තිබීම සුදුසු වුවද, ඇතැම් ක්‍රීඩකයින් ඒ ගැන තැකීමක් නොමැතිවීම/තමාට තමා පාලනය කර ගත නොහැකි අවස්ථාවලට යොමු වීම සිදුවන බවටත්,

❖ එහිදී ක්‍රීඩකයා පමණක් නොව, මුළු කණ්ඩායමද, රටද අපකීර්තියට පත්වන බවටත්,

❖ ක්‍රීඩකයන්ගේ පෞද්ගලික කළමනාකරුවන්ට ද ප්‍රමිතියක් තිබිය යුතු බවටත්, අනාවරණය වී ඇති හෙයින්,

1. විශේෂයෙන් ජාත්‍යන්තර තරගාවලියකට පිටත් වීමට පෙර සියළුම ක්‍රිකට් ක්‍රිඩකයින් පිලිපැදිය යුතු විනය, ආචාරධර්ම සහ වාර්ෂික ගිවිසුම් පිළිබදව වැඩමුලුවක් පවත්වා , සැම ක්‍රිඩකයෙක්ම එය තේරුම් ගත් බවට වෙන් වෙන් වශයෙන් ලිඛිතව අත්සන් ගැනිමෙන් සහ එය උල්ලංගණය සිදු කරනු ලබන සැම ක්‍රිඩකයෙකුටම නියමිත දඩුවම ලිහිල් නොකොට ලබා දීමත් ,

2. රාත්‍රි ආහාර ගැනීමට යැයි ක්‍රීඩකයින් කැසිනෝශාලා වලට ගියද, එම පරමාර්ථය පමණක් ඉටු නොකරමින්, විනය විරෝධී ක්‍රීඩාවක් වූ කැසිනෝ ක්‍රීඩාවෙහිද යෙදෙන බවට පමණක් නොව අනවශ්‍ය ආරවුල්වලටද යොමුවිය හැකි බවට ද තොරතුරු පවතින බැවින්, ක්‍රීඩකයින් කැසිනෝ ශාලාවලට යාම තහනම් කිරීමටත් සහ

3. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමග ගිවිසුම් අත්සන් කර ඇති ක්‍රීඩකයන් සියලු දෙනාටම සමාජ්‍ය මාධ්‍ය භාවිතාව සම්බන්ධයෙන් ඉතා දැඩි නීති පැන විය යුතු වීම සහ එය කඩ කරන ක්‍රීඩකයින්ට දැඩි දඩුවම් දිය යුතු බවත්,

4. විනය විරෝධී ක්‍රියා සඳහා දෙන දඩුවම් එලෙසම ක්‍රියාත්මක විය යුතු බවත්, බාහිර බලපෑම් නිසා දඩුවම් වෙනස් නොවිය යුතු බවත්, එසේ ම ක්‍රීඩකයන් තෝරා ගැනීමේ දී තේරීම් කමිටුවට කිසිදු බාහිර බලපෑමක් නොතිබිය යුතු බවත්,

5. විදේශ සංචාරයක් තුලදී ක්‍රීඩකයන්ගේ බිරින්දෑවරුන් රැගෙන යාමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මගින් වසර 2016 වනතෙක් අවසර දී තිබු

නමුත් දැනට එය නවතා ඇත. පළමු සතියෙන් පසුව ක්‍රීඩිකයින්ට ලබාදී ඇති හෝටල් කාමරයේම බිරින්දෑවරුන් තබා ගැනීමට අවසර දීමෙන් ක්‍රීඩකයන්ට මානසික සහනයක් ලබාගැනීමට පමණක් නොව, රාත්‍රී කාලයේදී අනවශ්‍ය ගමන් බිමන් යාම වැලකීමද, පමණක් නොව, අවිවාහක ක්‍රීඩකයන්ද මෙමගින් හෝටලයෙන් පිටව යාමේ ප්‍රවනතාවයද අඩුවී යාම සිදුවන බැවින්, ක්‍රීඩිකයින්ට ඔවුන්ගේ වියදමින් බිරින්දෑවරුන් රැගෙන යාමට අවසර දීම සුදුසු බවත්,

6. ජාතික කණ්ඩායම් භාර කළමනාකරු සහ කණ්ඩායම් නායක නිසියාකාරව කණ්ඩායම පාලනය කිරීමේ හැකියාවක් සතු පුද්ගලයෙකු විය යුතු බවටත්,

නිර්දේශ කරමු.

- **ක්‍රීඩකයින්ගේ ශාරීරික යෝග්‍යතා**

තරඟයක දී ජයග්‍රහණයන් අත්පත් කර ගැනීමට, ක්‍රීඩකයන්ගේ මානසික සහ ශාරීරික යෝග්‍යතාවය අතවශ්‍යා ප්‍රධාන සාධක දෙකකි.

❖ ඉදිරිපත් වූ සාක්ෂි ව-ලට අනුව, ක්‍රීඩකයින්ගේ ශාරීරික යෝගතා තරඟාවලියෙන් තරඟාවලියට, තේරීම් කමිටුව විසින් සොයා බැලුවද, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ තෝරා ගැනීම්වලට සම්බන්ධ නොවන බවට 'ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව' විසින් ලිඛිතව කරන ලද දැනුම් දීමකට අනුව ඕස්ට්‍රේලියාවේ පැවැති ටී. 20 ලෝක කුසලාන තරඟාවලිය සඳහා ක්‍රිකට් ක්‍රීඩක සංචිතය තෝරා ගැනීමේදි ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව සහභාගිත්වය නොතිබුණ බවටත්, ඒ මත දැඩි බලපෑමක් වන බවටත් කරුණු අනාවරණය වී ඇති හෙයින්ද.

❖ අප රටේ, ජාතික කණ්ඩායමට ක්‍රීඩා කළ හැකි ක්‍රීඩකයෙකුට සුදුසුකම් ලැබීම සඳහා, කි.මී.2. විනාඩි 8යි, තත්. 55 දක්වාත්, මේදය 80 සිට 85 දක්වාත් තිබීම ප්‍රමාණවත් වුවද, එංගලන්ත නවසීලන්ත, ඕස්ට්‍රේලියානු වැනි කණ්ඩායම් වල වේගය විනාඩි 7යි, තත්. 30 දක්වාත් මට්ටමටත් , මේදය 65 මට්ටමටත් පවතින බැවින්, ක්‍රිකට් ක්‍රීඩාව ජාත්‍යාන්තර තලයේ දි ජයග්‍රහණයන් කරා ගෙන යාම සඳහා අපේ රටේ ක්‍රීඩකයන්ගේ ශාරිරික යෝග්‍යතාවය ඉහළ මට්ටමක තිබිය යුතු බවට නිරීක්ෂනය වන හෙයින්ද

- ❖ ඉහළ කාර්ය සාධන මධ්‍යස්ථානය මගින් (High performance Center) ක්‍රීඩකයන්ගේ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ හතරක් අවුරුද්දකට සිදු කරමින්, පරීක්ෂණවල දී ක්‍රීඩකයින්ට ඉහත සඳහන් නිර්නායකයන් නොමැති නම්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයත් සමඟ ඔවුන්ට පවතින ගිවිසුමට අනුව ලැබිය යුතු මුදලින් පිළිවෙලින් 20%, 40%, 60%, 80% වශයෙන් අඩු කිරීමක් සිදු කරයි. 80% දී , හතර ම අසමත් වූ අය තෝරා නොගන්නා බවට අනාවරණය වන හෙයින්ද,
- ❖ ඉහත නිර්නායකයන්ට අනුව තෝරාගෙන තිබූ දුෂ්මන්ත චමීර සහ බිනුර ප්‍රනාන්දු යන ක්‍රීඩකයින් දෙදෙනාට, අවුරුදු දෙකක කාලයක් තිස්සේ බරපතල ආබාධ (එක්කෙනෙකුට වළලුකරෙහි ආබාධයක් සහ අනෙක් කෙනාට කකුලෙහි මස් පිඩු වේදනා) තිබූ මුත්, ඒ අයගේ ශාරීරික යෝග්‍යතා කළමනාකරණය කරමින් ටී.20 ලෝක කුසලාන තරඟාවලියට සහභාගි කර තිබූ බවටද , අනතුරුව, ටී.20 ලෝක කුසලාන තරඟාවලියේදී, දුෂ්මන්ත චමීර නැවතත් ආබාධය තිබූ පාදයටම ආබාධයට ලක්වී, සංචිතයෙන් ඉවත් කර, පෙර සිටම ඕස්ට්‍රේලියාවේ දී සැලසුම් කර තිබූ ශල්‍ය ශල්‍ය කර්මයට යොමු කර තිබූ බවටද, බිනුර ප්‍රනාන්දු ද පාදයෙහි මස් පිඩු වල පැවති ආබාධයට නැවතත් ලක්වී ඔහු වෙනුවට අසිත ප්‍රනාන්දු කැඳවා තිබූ බවටද,
- ❖ අවධානමක් සහිතව දුෂ්මන්ත චමීරව තෝරා ගෙන තිබුනේ ඔහු ලංකාවේ සිටින දක්ෂතම වේග පන්දු යවන්නා වූ නිසා බැවින්ද,

- ❖ වමත් පන්දු යවන දෙවන පෙළ ක්‍රීඩකයෙක් ජාතික ක්‍රිකට් සංචිතයේ සිටියා නම්, බිනුර ප්‍රනාන්දුගෙන් පසුව ඒ වෙනුවට යැවීමට හැකියාව තිබුනද, සුදුසු ක්‍රීඩකයෙකු නොසිටි බවට ද,
- ❖ වර්තමානයේ ක්‍රිකට් ක්‍රීඩා සමාජ 26ක් ඇති මුත්, ක්‍රීඩකයන්ගේ ගුණාත්මක භාවය බෙදී යන හෙයින්, උසස් මට්ටමේ ප්‍රමිතියක් තිබෙන ක්‍රීඩකයන් බිහි නොවන බවටත්, ක්‍රීඩකයන්ගේ දක්ෂතා මට්ටම ජාත්‍යන්තර තලය සමග සැසඳීමේ දී අඩු මට්ටමක පවතින බවටත්, ක්‍රීඩකයින් විශාල සංඛ්‍යාවකට ටියර් A කණ්ඩායමට ක්‍රීඩා කිරීමට අවස්ථාව ලැබීම වාසියක් වුවද, ජාතික කණ්ඩායමට ක්‍රීඩා කිරීමට බොහෝමයක් ක්‍රීඩකයින්ට දක්ෂතා දැක්වීමට අවස්ථාව නොලැබෙන බැවින් උසස් මට්ටමේ දෙවන පෙළ ක්‍රිකට් ක්‍රීඩා කණ්ඩායමක් වර්තමානයේ දක්නට නොමැති බවටත්, බොහෝමයක් ක්‍රීඩකයින් රට අත හැර ගොස් ඇති බවටත්,

**අණාවරණය වන හෙයින්ද,**

1. වර්තමානයේ පාර්ශවයන් අතර පවතින මතභේද හේතුවෙන් ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතියට වන අහිතකර බලපෑම වළකාලීමට කටයුතු කරමින්, දෙපාර්ශවය ම එක්ව අනාගතයේ දී කටයුතු කිරීම ඉතා වැදගත් බවටත්, ඉහළ ම මට්ටමේ ක්‍රීඩා කරන සමාජවලට වැඩි ඡන්ද බලයක් දිය යුතු බවත්, ක්‍රිකට් ක්‍රීඩාවට අඩු දායකත්වයක්/ දායකත්වයක් නොමැති අයට ඡන්ද බලයක් නොදිය යුතු බවටත්,

2. දැනට පවත්වාගෙන යන ශ්‍රී ලංකා ජාතික කන්ඩායම තේරිමේදී අනුගමනය කරන ශාරීරික යෝග්‍යතා පරික්ෂනය සංශෝධනය කර අනිකුත් ජාත්‍යන්තර කණ්ඩායම් අනුගමනය කරනු ලබන ඉහල මටට්මේ ශාරීරික යෝග්‍යතා හඳුන්වාදීම මගින්, තරගයකදි හෝ තරගාවලියකදි ආබාධ නොමැති /ඉතාමත් අවම ක්‍රීඩකයින් යොමු කල යුතු බවටත් ,

3. දැනට තේරිපත්ව සිටින දෙවනපෙල හා තෙවන පෙල කණ්ඩායම් වලට ද ඉහත ක්‍රියාදාමයම අනුගමණය කර, ශ්‍රී ලංකා ජාතික කන්ඩායමට ඉතාමත් ශක්තිමත් දෙවනපෙල හා තෙවනපෙල කන්ඩායම් දෙකක් සාදා ගත යුතු බවටත්,

4. ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් සංචිතයට විශේෂ දක්ෂතා ඇති ක්‍රීඩකයන් සෙවීම සඳහා සෑම දිස්ත්‍රික්කයකම වැඩමුළු පවත්වා දක්ෂ පිති කරුවන්, වේග පන්දු යවන්නන්, විශේෂ දඟ පන්දු යවන්නන් සහ දක්ෂ තුන් ඉරියව් ක්‍රීඩකයන් තෝරා ගැනීමත්,

5. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය නව තනතුරක් ලෙස ‘ජේෂ්‍යයේ කළමනාකරුවකු" පත්කර සියලුම මට්ටමේ සිටින කළමනාකරුවන් වන, ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායම, ශ්‍රී ලංකා 'ඒ' කණ්ඩායම, ශ්‍රී ලංකා නැගී එන කණ්ඩායම සහ ශ්‍රී ලංකා 19 පහල කණ්ඩායම් මෙම තනතුර යටතට පත්කරමින් , සෑම කළමණාකරුවෙකුටම තරගාවලියකට පෙර සහ පසු කලයුතු ක්‍රියාකාරකම් සඳහා උපදෙස්, ලබා දීමට කටයුතු කිරීමත්,

6. දැනට පවතින දේශීය පළමු පෙළ ක්‍රීඩා සංගම් ප්‍රමාණය 10 කට පමණ සීමා කර, එමගින් ශ්‍රී ලංකා ජාතික කණ්ඩායමට, දෙවන පෙළ සහ තෙවන පෙළ කණ්ඩායම්වලට තෝරා ගැනීමටත්,

7. ක්‍රිකට් ක්‍රීඩක සංචිත තෝරා ගැනීමේදී , ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ තෝරා ගැනීම්වලට , ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව සහභාගිත්වය නැවතත් ලබා ගැනීමටත්,

**නිර්දේශ කරමු.**

1. විශ්‍රාමික මහාධි.විනිසුරු සරෝජනී කුසලා වීරවර්ධන මැතිනිය -
   (සාමාජික)
2. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් කිංස්ලි ප්‍රනාන්දු මැතිතුමා -
   (සාමාජික)
3. විශ්‍රාමික නියෝ.පොලිස්පති සුදත් නාගහමුල්ල මැතිතුමා -
   (සාමාජික)
4. විශ්‍රාමික රියර් අද්මිරාල් ආනන්ද පීරිස් මැතිතුමා -
   (සාමාජික)
5. ක්‍රිකට් ක්‍රීඩක නලින් ද අල්විස් මැතිතුමා -
   (සාමාජික)

**2023.01.10**